# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 71 — 1973 අගෝස්තු 03 වැනි සිකුරාදා — 1973.08.03**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

(වෙන වෙනම ගොනුකර ගත හැකි.පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

# IV වැනි කොටස—පළාත් පාලනය


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 753 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 759 |
| කොන්ත්‍රාත්තු—ඇබෑර්තු ... ... ... | 755 | අය–වැය ලේඛන ... ... ... | 765 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අකුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... ... | 770 |


සැලකිය යුතුයි.—(i) මග්ගොන තරුණ බෞද්ධ සංගම් පනත් කෙටුම්පත, ශ්‍රී ලංකා ලාදුරු රෝග මර්දන සංගම් පනත් කෙටුම්පත සහ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය (නීති ගත කිරීමේ) පනත් කෙටුම්පත 1973 ජූලි මස 20 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 29 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදීම පිළිබඳ (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 30 දරණ ශ්‍රී ලංකා පලතුරු මණ්ඩල පනත 1973 අගෝස්තු මස 03 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

## පළාත් පාලන නිවේදන

වැල්ලවාය ගම්සභාව

ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද රීතිය.

fපී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1973 ජූලි මස 18 වැනි දින,
කොළඹ දී ය.

**රීතිය**

176 වැනි අධිකාරිය වන ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ සාදන ලදුව, 1919 අප්‍රේල් මස 04 වැනි දින අංක 7,004 දරණ ගැසට් පත්‍රයෙහි පල කරන ලද්දාවූද 1943 අප්‍රේල් මස 09 වැනි දින අංක 9,108 දරණ ගැසට් පත්‍රයෙහි පලවූ රීතියෙන් සංශෝධනය කරන ලද්දාවූද රීති වැල්ලවාය ගම්සභාවේ පරිපාලන සීමා ඇතුළතවූ ප්‍රදේශයට අදල වන ප්‍රමාණයට එහි 3.අ. වැනි රීතියෙහි දක්වා ඇති ගාස්තු ක්‍රමය වෙනුවට පහත සඳහන් අළුත් ගාස්තු ක්‍රමය ආදේශ කිරීමෙන් ඒ රීති මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

| | එක් දිනක් සඳහා | එක් මාසයක් සඳහා | එක් අවුරුද්දක් සඳහා (දෙසැ. 31න් අවසන් වන) |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| (2) ආසන පහසුව සැපයෙන තැනැත්තන්ගේ ගණන 199කට වැඩි නොවන කල්හි ... | 5 0 ... | 50 0 ... | 200 0 |
| (1) ආසන පහසුව සැපයෙන තැනැත්තන්ගේ ගණන 199කට වැඩි නමුත් 399 කට වැඩි නොවන කල්හි ... | 10 0 ... | 100 0 ... | 400 0 |
| (3) ආසන පහසුව සැපයෙන තැනැත්තන්ගේ ගණන 399කට වැඩි කල්හි ... | 15 0 ... | 150 0 ... | 600 0 |

8–42—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම් සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. ඩී. සිල්වා,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1973 ජනවාරි මස 7 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

එල්.සී.—බී. 89/52.

### තානායම් පනත

තත් කාර්‍ය්‍යය සඳහා උචිත බලධරයා වන කුරුණෑගල මහ නගර සභාව විසින් කුරුණෑගල තානායම සම්බන්ධයෙන් (275 වන අධිකාරයවූ) තානායම් පනතේ 4 වන වගන්තිය යටතේ සාදනු ලැබ, එම වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ රීතිය.

ජී. බී. වික්‍රමනායක,
අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1973 ජූලි මස 02 වැනි දින,
කොළඹ දී ය.

### රීතිය

1959 ජූලි 24 වන දින අංක 11,814 දරණ ගැසට් පත්‍රයේ පල කරනු ලැබ. 1967 දෙසැම්බර් 31 වන දින අංක 14,781/6 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද රීතිය මගින් අවසාන වරට සංශෝධිත කුරුණෑගල තානායමට අදල රීතිය, එහි සඳහන් උපලේඛනය වෙනුවට පහත දක්වෙන අලුත් උපලේඛනය ආදේශ කිරීමෙන්, තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

### උපලේඛනය

තානායම පාවිච්චි කිරීම හා නැවතීම සම්බන්ධ ගාස්තු.—

නැවතීමේ ගාස්තු

රු. ශ.

(අ) තානායමේ නිදන කාමර නොවන යම් කොටසක් පාවිච්චි කිරීම—
එක් එක් පැයකට හෝ පැයකින් කොටසක් සඳහා ... 0 40

(ආ) අංක 1 සිට 8 දක්වා නිදන කාමර අතුරින් යම් කාමරයක් පාවිච්චි කිරීම—
(1) පැය 6කට නොවැඩි කාලසීමාවක් සඳහා ... 3 0
(2) පැය 6කට වැඩි එහෙත් පැය 12කට නොවැඩි කාල සීමාවක් සඳහා ... ... ... 4 0
(3) පැය 12කට වැඩි කාලසීමාවක් හෝ එක් එක් පැය 24ක හෝ ඉන් කොටසක කාලසීමාවක් සඳහා ... 5 0

(ඉ) අංක 9 සිට 12 දක්වා නිදන කාමර අතුරින් යම් කාමරයක් පාවිච්චි කිරීම—
පැය 24ක හෝ ඉන් කොටසක කාලසීමාවක් සඳහා ... 7 50

(ඇඳක්, සෝපාවක් හෝ කට්ටියක් සහ ඇඳ ඇතිරිලි, මෙස රෙදි, තුවා සහ විදුලි පහන් පාවිච්චි කිරීමේ ගාස්තු ද ඉහත සඳහන් ගාස්තු වලට ඇතුළත් වේ.)

මෝටර් වාහන

වාහනාගාරයක් පාවිච්චි කිරීම—
පැය 24ක් හෝ ඉන් කොටසක කාලසීමාවක් සඳහා ... 2 50

තානායම් භූමියේ මෝටර් වාහනයක් නවතා තැබීම—
පැය 24ක හෝ ඉන් කොටසක කාලසීමාවක් සඳහා ... 1 0

ඇබ ගාස්තු (කෝකේජ්)

තානායම් භාරකරු විසින් සපයනු නොලබන ධාන්‍ය මත්පැන් තානායම් භූමි භාගයේදී පානය කරනු ලබන අවස්ථාවකදී එක් බෝතලයකට හෝ ඉන් කොටසක් සඳහා ... ... 1 0

තානායම් භාරකරු විසින් සපයනු නොලබන ධාන්‍ය මත්පැන් නොවන ඕනෑම මත්පැන් වර්ගයක් තානායම් භූමි භාගයේදී පානය කරනු ලබන අවස්ථාවකදී එක් බෝතලයකට හෝ ඉන් කොටසක් සඳහා ... ... ... 2 50

දිවා භෝජනය

තානායම් භාරකරු විසින් සපයනු නොලබන කෑම වේලක් තානායම් භූමි භාගයේදී අනුභව කරන අවස්ථාවකදී—
හැඳිගෑරුප්පු හෝ පිඟන් කෝප්ප සපයනු ලැබූ එක් එක් තැනැත්තා සඳහා ... ... ... ... 1 0

8–7—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### පළාත් පාලන දෙපාර්තමේන්තුව

බදුල්ල මහ නගර සභාවේ සීමා දීර්ඝ කිරීම හා ඡන්ද කොට්ඨාශ නැවත බෙදා වෙන් කිරීම

පළාත් පාලන කොමසාරිස්තුමා විසින් පහත සඳහන් අයගෙන් සමන්විත නිළ කමිටුවක් :—

(1) වී. පී. අබේවික්‍රම (පෙරකදෝරු මහතා), බදුල්ල (සභාපති),

(2) බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, ඊ. අයි. කමාල්දීන් මහතා (සාමාජික),

(3) සහකාර මැණුම් අධිකාරි, ඩී. ඩී. සී. ශ්‍රීන්දෙණිය මහතා (සාමාජික).

පහත සඳහන් කරුණු පරීක්ෂා කර බලා වාර්තා කිරීම පිණිස පත්කර ඇති බව මෙයින් නිවේදනය කරමි :—

(අ) බදුල්ල මහ නගර සභාවට යාබදව පිහිටා ඇති යථෝක්ත නාගරික සංවර්ධනය නිසා මහ නගර සභාවට ඇතුලත් කළ යුතු වූ ප්‍රදේශය තීරණය කිරීම,

(ආ) මහ නගර සභාවේ අභිනව සීමා නියම කිරීම,

(ඇ) ප්‍රදේශයේ ජනගහනය, ඡන්ද සංඛ්‍යාව, විශාලත්වය හා ප්‍රජා අයිතිවාසිකම් ආදිය සැලකිල්ලට යොමු කොට බදුල්ල මහ නගර සභාව සමන්විත විය යුතු සභික සංඛ්‍යාව නිශ්චය කිරීම,

(ඈ) නැවත බෙදා වෙන් කරණු ලබන එක් එක් ඡන්ද කොට්ඨාශයේ ඡන්ද සංඛ්‍යාවෙහි හැකි තරම් දුරට සමාන බවක් ඇතිවන පරිදි මහ නගර සභාවේ එක් එක් ඡන්ද කොට්ඨාශයේ සීමාවන් විස්තර කිරීම,

(ඉ) යාබද පළාත් පාලන ආයතනයන්ට අයත් ප්‍රදේශ වලින් කවර කොටසක් හෝ මහ නගර සභාවට ඇතුලත් කළහොත් ඒ නිසාවෙන් එම පළාත් පාලන ආයතනයන් සතුවිද්‍යායක ආර්ථික පදනමක් මත ගෙන යෑමට පුළුවන් ද යන්න සොයා බැලීම,

(ඊ) මහ නගර සභාවේ සීමා දීර්ඝ කිරීම හේතුකොටගෙන යාබද පළාත් පාලන ආයතනවල මායිම් හා ඡන්ද කොට්ඨාශ නැවත විස්තර කොට නිරූපනය කිරීමත් වේ.

මේ සම්බන්ධයෙන් නියෝජනයන් ඉදිරිපත් කිරීමට කැමති සංවිධාන හා මහජනයා 1973 අගෝස්තු මස 24 වැනි දිනට පෙර එවැනි නියෝජනයන් පිටපත් 4 කින් යුතුව බදුල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබෙන්නට ලියාපදිංචි තැපෑලෙන් එවන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

වී. පී. අබේවික්‍රම,
නිළ කමිටුවේ සභාපති.

1973 ජූලි මස 23 දින,
බදුල්ලේ දී ය.

8-350—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### පළාත් පාලන දෙපාර්තමේන්තුව

මොණරාගල දිස්ත්‍රික්කයේ කඳුකර ගම් ප්‍රදේශය නැවත දෙකට බෙදා නව ගම් ප්‍රදේශ දෙකක් සංස්ථාපනය කිරීම.

මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි කඳුකර ගම් ප්‍රදේශය නැවත දෙකට බෙදා, පහත විස්තර දක්වා ඇති පරිදි නව ගම් ප්‍රදේශ දෙකක් සංස්ථාපනය කිරීමට යෝජනා කොට ඇත :—

(අ) යෝජිත පළමුවෙනි නව ගම් ප්‍රදේශය :

(1) අංක 131 දරණ යකුරාව,
(2) අංක 132 දරණ අලුපොත,
(3) අංක 133 දරණ වාසිපොනේ,
(4) අංක 134 දරණ වැකුඹුර සහ 134 ඒ දරණ කරවිලේ,
(5) අංක 139 දරණ අතලේ,

යන ග්‍රාමසේවක කොට්ඨාශ වලින් සමන්විත වේ.

(ආ) යෝජිත දෙවෙනි නව ගම් ප්‍රදේශය :

(1) අංක 135 දරණ වරාදොල,
(2) අංක 136 දරණ මියනකඳුර,
(3) අංක 137 දරණ හිඟුරුකඩුව සහ
(4) අංක 138 දරණ බෝගහපැලැස්ස

යන ග්‍රාමසේවක කොට්ඨාශ වලින් සමන්විත වේ.

(iii) රජයේ සේවයෙහි නියැලීව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදී ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදාල නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවාමුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවාමුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළකෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීයබලමණ්ඩලයන්හි සේවකයන්ම සුදුසු වන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දනට පළාත් පලාන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම් පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදවන්නට තමන් සූදානම්ව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයනට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබාගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

### අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙලකොට තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

——————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.
(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
ජාතිය :————.
(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :————. මාස :————. දින :————.
(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නුපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරිවිය යුතුය.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :
(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)—

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ආ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඇ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුර) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවෙද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### පශු ශල්‍ය වෛද්‍ය තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අපේක්ෂකයා, පළමුවරට කොළඹ නගර සභාවේ පශු වෛද්‍ය දෙපාර්තමේන්තුවට පත් කරනු ලැබේ. ඔහු මාරු කරනු ලැබීමටද යටත් වන්නේ ය.

2. තනතුරට අදාල වැටුප් පරිමාණය.—වසරකට රු. 6,720—12×360—5×480—රු. 13,440—කා. ක. රු. 11,040. (ඒකාබද්ධ)

තෝරා ගනු ලැබෙන අපේක්ෂකයා, පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත පශ්චාත් උපාධි පාඨමාලාවක් සාර්ථක ලෙස අනුගමනය කළහොත් මිස, වසරකට රු. 11,040 ඉක්මවීමට ඔහු සුදුසු නොවන්නේ ය.

අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඔහු ඉහත සඳහන් වැටුප් පරිමානයෙහි සුදුසු පියවරක තැබිය හැක.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස 1973.09.03 දිනට අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) ලංකා විශ්ව විද්‍යාලයෙහි පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය අයදුම්කරුවනට තිබිය යුතුයි. ලංකා විශ්ව විද්‍යාලයීය උපාධිධරයින් ලබා ගත නොහැකි වුවහොත්, පිළිගත් ඉන්දීය පශු වෛද්‍ය ආයතනයන්හි උපාධිධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් පිළිබඳව සලකා බලනු ලැබේ.

4. තෝරාගනු ලැබෙන අපේක්ෂකයාට, පෞද්ගලික වෘත්තියෙහි යෙදීමට අවසර නොලැබෙන අතර, ඔහු පත් කරනු ලැබෙන ප්‍රාදේශීය බලමණ්ඩල සීමාව තුළ පදිංචි වීම අවශ්‍ය වනු ඇත.

5. මෙම ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලනු මැනවි.

6. පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සම්පාදිත අයදුම්පත් 1973.09.03 දිනට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

7. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන, ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතන වල සේවයේ යෙදී සිටින නිලධාරින්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාර දී තිබී ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඒවා පිළිගන්නා ලෙස ඔවුන් නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් ලද බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 ජූලි 26 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

8–93—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### කර්මාන්තශාලා ෆෝර්මන් තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරු පළමුවන විරට කුරුණෑගල නාගරික සභාවට පත් කරනු ඇත.

2. **වැටුප්.**—තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 3,450—90×19—රු. 5,160 යනුවෙනි. රජයේ ප්‍රමාණයන්ට අනුව ව්වාහක දීමනාවක් ද ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) 1973.09.18 දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන් කාර්මික පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට ඉහළ විභාගයකින් සමත්ව තිබිය යුතුයි.

(ඇ) අයදුම්කරුවන්ට මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මනා දැනීමක් තිබිය යුතු අතර ඔවුන් ප්‍රාදේශීය බලමණ්ඩලයක් යටතේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක් යටතේ හෝ යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවක හෝ ප්‍රසිද්ධ ඉංජිනේරු වෙළඳායතනයක හෝ සේවයෙහි යෙදී කර්මාන්ත ශාලා පරිචය පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (මෙයින් අවුරුදු 5 ක් පරිපාලක තත්ත්වයක සේවය කර තිබිය යුතුය.) (අධ්‍යාපන සුදුසුකම් සහ කර්මාන්ත ශාලාවක වැඩ පිළිබඳව ඇති පළපුරුද්ද සනාථ කිරීම සඳහා සහතික පිටපත් අමුණා එවිය යුතුයි.)

4. මේ ගැසට් පත්‍රයේ IV කොටසේ ආරම්භයෙහි පළකර තිබුණ පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන සමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1973.09.18 දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

උප්පැන්න සහතිකය සහ අනෙකුත් සහතිකවල පිටපත් (මුල් සහතික නොව) අයදුම්පතට අමුණා එවිය යුතුයි. මේ ලියකියවිලිවල පිටපත් නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

6. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධරයෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිමට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර බාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණ බවට සහතික කර ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින් තමන් පත් කරන පළාත් පාලන ආයතනයේ සීමාව තුළ පදිංචි වීමට අවශ්‍ය විය හැකිය.

9. අවශ්‍ය සුදුසුකම් ඇති ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණ බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1973 ජූලි මස 26 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

8-349—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### වෛද්‍ය නිලධාරී (බෙහෙත් ශාලා) තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරු පළමු කොටම කොළඹ නාගරික සභාවේ සෞඛ්‍ය (රෝග සුවකිරීමේ) දෙපාර්තමේන්තුවට පත්කරගනු ලබන අතර, කොළඹ නාගරික සභා සීමාව තුළ වාසය කිරීමට නියම කරනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 9,600—4×360—11×480—රු. 16,320 වේ. මෙම වැටුප් ක්‍රමයෙන් වර්ෂයකට රු. 14,880 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත. පහත සඳහන් සුදුසුකම් නොමැති නිලධාරීන්ට ඉහත සඳහන් වැටුප් ක්‍රමයෙහි වර්ෂයකට රු. 14,400 යන වැටුපෙන් ඔබ්බට වැටුප් ලැබිය නොහැක :—

(i) ඩී. ටී. ඇම්. සහ එච්. (ලංකා) සහ ලංකා විශ්ව විද්‍යාලයේ හය මාස චිකිත්සාගාර අභ්‍යාශ පාඨමාලාව සහ ලංකා විශ්ව විද්‍යාල මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාව ;

හෝ

(ii) ඩී.ටී.ඇම්. සහ එච්. (එන්ගලන්තය) සහ බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාලයක හය මාසයක චිකිත්සාගාර පුහුණුව ;

හෝ

(iii) ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරින් සම්බන්ධ ව්‍යවස්ථාවේ පළමුවැනි උපග්‍රන්ථයෙහි සඳහන් ආකාරයෙන්, පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂඥ සුදුසුකම් (අංක 10,753 සහ 1955.1.13 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය බලනු මැනවි).

**සටහන.**—විශ්‍රාම වැටුප් රහිත දීමනා රජයේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—අයදුම්කරුවන්ට ඇම්. බී. බී. ඇස්. (ලංකා) උපාධිය හෝ ලංකා වෛද්‍ය සභාව විසින් ලියාපදිංචි කළ හැකි වෙනත් සමාන වෛද්‍ය සුදුසුකම් තිබිය යුතුයි. වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි කළ පසු යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්දක් ඇති වෛද්‍යවරුන්ගේ අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

4. පත්කරගනු ලබන අයදුම්කරු පෞද්ගලිකව වෛද්‍ය කර්මයෙහි යෙදීමට අවසර නැති අතර, දිවා කාලයෙහි හෝ රාත්‍රි කාලයෙහි ඕනෑම වේලාවක වැඩ කිරීමට සූදානම් විය යුතුයි.

5. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1973.09.03 දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘති පත්‍රයෙහි 9 වැනි ඡේදය වෙනුවට පහත සඳහන් කරුණු යොදා ගත යුතුයි :—

"9. (අ) ලියාපදිංචි කළ දිනය :————.

(ආ) ලබා ඇති වෛද්‍ය සහ වෘත්තීය සුදුසුකම්. ඒවා ලබාගත් දින වකවානු සහ ආයතනයන්ගේ නම් සහිතව :———.

(ඇ) චිකිත්සාගාර පුහුණුව සහ පශ්චාත් උපාධි පුහුණුවක් ඇත්නම්, ඒ පිළිබඳ විස්තර :————."

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මෙ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම ලැබී ඇති බවට සහතිය කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණ බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන්
සභාවේ ලේකම්.

1973.07.21,
තැ. පෙ. 530, කොළඹ.

8-94—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

## මාවනැල්ල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලය

### කම්බිකරු සහායක තනතුර (විදුලිය දෙපාර්තමේන්තුව)

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—(වාර්ෂික ඒකාබද්ධ) රු. 2,154—54—රු. 2,586 තනතුර ස්ථිරය.

3. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) වයස : 1973 අගෝස්තු 31 වෙනි දිනට අවුරුදු 22 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුය.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි).

(ආ) අපේක්ෂකයින් සිංහල ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් භාෂාව හා වෙනත් විෂය පහකින් ද දෙවරකට වැඩි නොවන වාර ගණනකදී සමත් වී සිටිය යුතුය. (සහතික පිටපත් ඇමිණිය යුතුයි).

(ඇ) අයදුම්කරුවෝ ලංකා කාර්මික විදුලි කම්බි ඇදීම පිළිබඳ පාඨමාලාව හෝ විදුලි කම්බි ඇදීම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන පාඨමාලාව හෝ සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය (සහතික පිටපත් ඇමිණිය යුතුයි).

(ඈ) අයදුම්කරුවෝ ප. පා. ආ. ආණ්ඩුවේ ආයතනයක හෝ සංස්ථාවක විදුලි ආලෝක ව්‍යාපාරයන් හි යටතේ පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් ඇතිව සිටිය යුතුය. (සහතික පිටපත් ඇමිණිය යුතුයි).

ඉහත 'ඈ' කොටසේ සඳහන් සහතිකය ලබා ගත් පසු නගර විදුලි ආලෝක ව්‍යාපාරයන් හි යටත් පිරිසෙයින් අවුරුදු 2 ක පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිලි දක්වනු ලැබේ.

(ඉ) මනා සෞඛ්‍ය තත්ත්වයක සිටිය යුතුය.

(ඊ) මාවනැල්ල නගර සීමාව තුළ පදිංචිකරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. **ඉල්ලුම් පත්.**—ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකසා ගත් අයදුම් පත් 1973 අගෝස්තු මස 31 වැනි දින හෝ ඊට පෙර මාවනැල්ල නගරයේ විශේෂ කොමසාරිස් වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

5. තෝරා පත් කර ගනු ලබන අයදුම්කරු සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලැබිය යුතුයි.

6. මෙම තනතුර අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වන අතර එකී කාලය අවසානයේ ස්ථිර කිරීම සලකා බලනු ඇති අතර ආධුනික කාලය තුළ ඕනෑම අවස්ථාවක සේවය නැවැත්වීමට වුවද යටත් වේයි.

හෙ. කු. පැ. විජේසිංහ,
මාවනැල්ල නගරයේ විශේෂ කොමසාරිස්.

1973 ජූලි මස 23 වෙනි දින,
මාවනැල්ල නගරයේ විශේෂ කොමසාරිස්
කාර්යාලයේ දීය.

8-317—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## මැල්ලව ගම්සභාව

### කම්බිකරු සහායක තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා 1973 අගෝස්තු මස 25 වෙනි දින තෙක් අයදුම්පත් මා විසින් භාරගනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 504—30×8—රු. 744 (මාර්ගික ඒකාබද්ධ රුපියල් 2,154—54×8—රු. 2,586).

3. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) 1973.08.01 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන් අඩු වශයෙන් සිංහල 7 වැනි ප්‍රමාණය සමත්ව සිටිය යුතුයි.

(ඇ) අයදුම්කරුවන් ලංකා කාර්මික විද්‍යාලයේ විදුලි කම්බි ඇදීම පිළිබඳ පාඨමාලාව හෝ විදුලි කම්බි ඇදීම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන පාඨමාලාව හෝ සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති අය විය යුතුය.

(ඈ) අයදුම්කරුවන් පළාත් පාලන ආයතනයක, ආණ්ඩුවේ ආයතනයක හෝ සංස්ථාවක විදුලි ආලෝක ව්‍යාපාරයක් යටතේ යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් ඇතිව සිටිය යුතුය.

ඉහත (ඈ) කොටසේ සඳහන් සහතික ලබා ඇතොත් ඊට පසු නගර විදුලි ආලෝක ව්‍යාපාරයන් යි යටත් පිරිසෙයින් අවුරුදු 2 ක පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. අයදුම්කරුවන් යහපත් චරිතයක් ඇති අය විය යුතුය. (මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් ඉදිරිපත් කළ යුතුය).

5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදකට වරදකරු වූ හෝ දුෂ්චරිතයක් වශයෙන් රජයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයකින් හෝ නීතිගත සංස්ථාවකින් අස් කළ අයෙකු නොවිය යුතුයි.

6. මෙම ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළ කර තිබෙන කොන්දේසි යටතේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට සාරානුකූලව සකස් කොට නියමිත දිනට පෙර අයදුම්පත් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

කේ. පී. ජයසේන,
මැල්ලව ගම්සභාවේ සභාපති.

මැල්ලව ගම්සභා කාර්යාලය,
මරලුවාව, කුරුණෑගල,
1973 ජූලි මස 18 දින දීය.

8-109—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## ලුණුගල සුළු නගර සභාව

### 1971 වර්ෂයේ ආදයම් හා වියදම් ප්‍රකාශනය

| ආදයම් | රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම් | ... | ... | 35,351 | 1 |
| බී.—මහාමාර්ග | ... | ... | 268 | 45 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි | | ... | 1,878 | 50 |
| ඩී.—මහජන සෞඛ්‍යය | ... | ... | 10,307 | 91 |
| **වෙනත් ලැබීම්** | | | | |
| 1. නැන්පත් (සාමාන්‍ය) | ... | ... | 5,372 | 37 |
| 2. නැන්පත් (විදුලිය) | ... | ... | 1,315 | 0 |
| 3. අත්තිකාරම් ... | ... | ... | 5,559 | 86 |
| 4. විදුලිය අංශයේ ආදයම | ... | ... | 49,992 | 85 |
| 5. විදුලිය ක්ෂය සංචිතය | ... | ... | 500 | 0 |
| 6. විවිධ ණය ගැතියෝ | ... | ... | 11,969 | 12 |
| 7. විවිධ ණය හිමියෝ | ... | ... | 10,617 | 54 |
| 8. රජයේ ආධාර ... | ... | ... | 3,180 | 0 |
| 9. අධිකතා හා ඌණතා (සාමාන්‍ය) | | ... | 11,851 | 26 |
| 10. අධිකතා හා ඌණතා (විදුලිය) ... | | ... | 9 | 82 |

| වියදම් | රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් ... | ... | ... | 22,415 | 44 |
| බී.—මහාමාර්ග ... | ... | ... | 7,979 | 14 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි | ... | ... | 1,046 | 9 |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | ... | ... | 17,066 | 82 |
| **වෙනත් ගෙවීම්** | | | | |
| 1. නැන්පත් (සාමාන්‍ය) ... | ... | ... | 8,289 | 37 |
| 2. නැන්පත් (විදුලිය) ... | ... | ... | 956 | 60 |
| 3. අත්තිකාරම් ... | ... | ... | 1,825 | 49 |
| 4. විදුලිය අංශයේ වියදම් | ... | ... | 49,928 | 60 |
| 5. විවිධ ණය ගැතියෝ ... | ... | ... | 9,412 | 70 |
| 6. විවිධ ණය හිමියෝ ... | ... | ... | 1,693 | 75 |
| 7. රජයේ ආධාර ... | ... | ... | 4,573 | 90 |
| 8. අධිකතා හා ඌණතා (සාමාන්‍ය) | ... | ... | 3,089 | 34 |
| 9. අධිකතා හා ඌණතා (විදුලිය) | ... | ... | 104 | 50 |

**වෙනත් ලැබීම්—(සම්බන්ධයි)**

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| 11. ආදයම් රැස්කිරීමේ ගිණුම : | | | |
| දේපල බදු ... | ... | 11,913 56 | |
| වැසිකිලි බදු | ... | 5,402 90 | |
| ජල බදු ... | ... | 5,026 92 | |
| වරෙන්තු ගාස්තු | ... | 1,187 42 | |
| විදුලිය ගාස්තු | ... | 37,566 58 | |
| කුලී ... | ... | 2,982 50 | |
| | | | 64,079 88 |
| 1971.01.01 දිනට මුදල් පොත අනුව ශේෂය | ... | | 18,514 49 |
| | | | 2,30,768 6 |

**වෙනත් ගෙවීම්—(සම්බන්ධයි)**

| | | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|
| 10. ආදයම් රැස්කිරීමේ ගිණුම : | | | | |
| දේපල බදු | ... | ... | 6,866 56 | |
| වැසිකිලි බදු | ... | ... | 2,515 71 | |
| ජල බදු | ... | ... | 2,712 60 | |
| වරෙන්තු ගාස්තු | ... | ... | 1,360 18 | |
| විදුලිය ගාස්තු | ... | ... | 37,180 55 | |
| කුලී | ... | ... | 3,029 50 | |
| | | | | 53,665 10 |
| 1971.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය | | | ... | 48,721 22 |
| | | | | 2,30,768 6 |

ලුණුගල සුළු නගර සභාවේ සභාපති ඉද්වසිංහගේ වියුජීන් දයානන්ද වීරසේකර වන මම පූර්වෝක්ත වාර්තා මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1971 වර්ෂයේ ලුණුගල සුළු නගර සභාවේ ආදයම් හා වියදම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත් ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

ඩී. වී. ඩී. වීරසේකර,
ලුණුගල සුළු නගර සභාවේ සභාපති.

නිවැරදි බවට සහතික කරමි.

ඇම්. කේ. පබිලිස් අප්පුහාමි,
ලුණුගල සුළු නගර සභාවේ අංක 5 කොටසේ සභික.

1972 අප්‍රේල් මස 05 වැනි දින මා ඉදිරිපිට ලුණුගල දී සහතික කරන ලදී.

ඒ. ඇම්. සෝමපාල,
සුළු නගර සභාවේ උප සභාපති හා සමාදාන විනිශ්චයකාර තැන,
ලුණුගල.

**1971 දෙසැම්බර් 31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය**

**බැරකම්**

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත්—සාමාන්‍ය ... | ... | 2,540 29 | |
| විදුලිය ... | ... | 7,390 6 | |
| | | | 9,930 35 |
| රජයේ ආධාර—විවිධ | ... | 4,980 75 | |
| පුස්තකාලය | ... | 3,180 0 | |
| මංමාවත් | ... | 365 68 | |
| | | | 8,526 43 |
| ක්ෂය සංචිතය ... | ... | ... | 4,600 0 |
| විවිධ ණය හිමියෝ ... | ... | ... | 10,807 4 |
| අධිකතා හා ඌණතා (සාමාන්‍ය) ගිනුම : | | | |
| 1971.01 01 දින සිට බැර කිරීම් | ... | 8,761 92 | |
| 1971.01.01 දිනට ඌණතාවය | ... | 2,879 15 – | |
| | | 5,882 77 | |
| 1971.01.01 දින සිට ආදයම | ... | 47,805 87 | |
| | | 53,688 64 | |
| 1971.01.01 දින සිට වියදම | ... | 48,507 49 | |
| | | | 5,181 15 |
| අධිකතා හා ඌණතා (විදුලිය) ගිනුම : | | | |
| 1971.01.01 දිනට අධිකය | ... | 39,947 51 | |
| 1971.01.01 දින සිට ගැලපීම් | ... | 94 68 – | |
| | | 39,852 83 | |
| 1971.01.01 දින සිට ආදයම | ... | 49,992 85 | |
| | | 89,845 68 | |
| 1971.01.01 දින සිට වියදම | ... | 49,928 60 | |
| | | | 39,917 8 |
| | | | 78,962 5 |

**වත්කම්**

| | | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|
| ආදයම් රැස්කිරීමේ ගිණුම : | | | | |
| දේපල බදු | ... | ... | 7,018 47 | |
| වැසිකිලි බදු | ... | ... | 1,688 93 | |
| ජල බදු | ... | ... | 1,016 97 | |
| වරෙන්තු ගාස්තු | ... | ... | 714 77 | |
| විදුලිය ගාස්තු | ... | ... | 6,646 9 | |
| කුලී ... | ... | ... | 672 0 | |
| | | | | 18,757 23 |
| අත්තිකාරම් | ... | ... | ... | 590 65 |
| විවිධ ණය ගැතියෝ | ... | ... | ... | 10,892 95 |
| 1971.12.31 දිනට මුදල් පොත් අනුව ශේෂය | | | ... | 48,721 22 |
| | | | | 78,962 5 |

ලුණුගල සුළු නගර සභාවේ සභාපති දේවසිංහගේ වියුජීන් දයානන්ද වීරසේකර වන මම මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට ඉහත සඳහන්ව ඇති ලුණුගල සුළු නගර සභාවේ 1971.12.31 දිනට වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය සැබෑ හා නිවැරදිවූවක් බැව් මෙයින් සහතික කරමි.

ඩී. වී. ඩී. වීරසේකර,
සභාපති,
ලුණුගල සුළු නගර සභාව.

නිවැරදි බවට සහතික කරමි.

ඇම්. කේ. පබිලිස් අප්පුහාමි,
ලුණුගල සුළු නගර සභාවේ අංක 5 දරණ කොටසේ සභික.

1972 අප්‍රේල් 05 වැනි දින ලුණුගලදී මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඒ. ඇම්. සෝමපාල,
සුළු නගර සභාවේ උප සභාපති හා සමාදාන විනිශ්චයකාර තැන,
ලුණුගල.

8–259/1—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

## ලුණුගල සුළු නගර සභාව

### 1972 වර්ෂයේ ආදායම් හා වියදම් ප්‍රකාශනය

| | රු. ශ. | රු. ශ. | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... | | 47,115 43 | ඒ.—සාමාන්‍ය වියදම ... ... | | 21,589 87 |
| බී.—මංමාවත් ... ... | | 268 45 | බී.—මංමාවත් ... ... | | 8,148 13 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි | | 2,814 0 | සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි ... | | 2,473 27 |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | | 12,198 53 | ඩී.—මහජන සෞඛ්‍යය ... ... | | 24,376 42 |
| ඊ.—මහජන විනෝදය ... | | 36 60 | ජේ.—කියවීම්ශාලා සහ පුස්තකාල ... | | 1,965 92 |
| ජී.—බල්ලන් ලියා පදිංචි කිරීම ... | | 3 0 | | | |
| ජේ.—කියවීම්ශාලා සහ පුස්තකාල ... | | 535 0 | | | |
| | | 62,971 1 | | | 58,553 61 |
| **වෙනත් ලැබීම් :** | | | **වෙනත් ගෙවීම් :** | | |
| 1. තැන්පත් (සාමාන්‍ය) ... | | 8,458 71 | 1. තැන්පත් (සාමාන්‍ය) ... | | 7,669 96 |
| 2. තැන්පත් (විදුලිය) ... | | 2,410 0 | 2. තැන්පත් (විදුලිය) ... ... | | 720 30 |
| 3. අත්තිකාරම් ... ... | | 2,468 77 | 3. අත්තිකාරම් ... ... | | 2,649 12 |
| 4. ක්ෂය සංචිත ගිනුම ... | | 500 0 | 4. ක්ෂය සංචිත ගිනුම ... | | 2,250 0 |
| 5. රජයේ ආධාර ... | | 2,500 0 | 5. රජයේ ආධාර ... ... | | 5,300 10 |
| 6. විවිධ ණය හැකියෝ ... | | 9,850 60 | 6. විවිධ ණය හැකියෝ... ... | | 18,412 66 |
| 7. විවිධ ණය හිමියෝ ... | | 10,339 7 | 7. විවිධ ණය හිමියෝ ... ... | | 10,807 4 |
| 8. අධිකතා හා ඌණතා (සාමාන්‍ය) | | 1,134 28 | 8. අධිකතා හා ඌණතා (සාමාන්‍ය) ... | | 132 7 |
| 9. අධිකතා හා ඌණතා (විදුලිය) | | 3 0 | 9. විදුලිය අංශයේ ගෙවීම් ... | | 49,339 66 |
| 10. විදුලිය අංශයේ ලැබීම් ... | | 50,975 26 | 10. ආදායම් රැස්කිරීමේ ගිනුම : | | |
| 11. ආදායම් රැස්කිරීමේ ගිනුම : | | | දේපල බදු ... ... | 8,634 77 | |
| දේපල බදු ... ... | 9,016 59 | | වැසිකිලි බදු ... ... | 3,220 58 | |
| වැසිකිලි බදු ... | 3,332 93 | | ජල බදු ... ... | 3,455 35 | |
| ජල බදු ... ... | 3,460 18 | | වරෙන්තු ගාස්තු ... ... | 789 43 | |
| වරෙන්තු ගාස්තු ... | 728 95 | | විදුලිය ගාස්තු ... ... | 40,390 67 | |
| විදුලිය ගාස්තු ... | 39,496 93 | | ගෙවල් කුලී ... ... | 3,495 0 | |
| ගෙවල් කුලී ... | 3,156 0 | | | | 59,985 80 |
| | | 59,191 58 | 1972.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය ... | | 43,703 18 |
| 1972.01.01 දිනට මුදල් පොත අනුව ශේෂය ... | | 48,721 22 | | | |
| | | 2,59,523 50 | | | 2,59,523 50 |

ලුණුගල සුළු නගර සභාවේ සභාපති දේවසිංහගේ වියුජින් දයානන්ද වීරසේකර වන මම පූර්වෝක්ත මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1972 වර්ෂයේ ලුණුගල සුළු නගර සභාවේ ආදායම් හා වියදම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත් ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

ඩී. වී. ඩී. වීරසේකර,
ලුණුගල සුළු නගර සභාවේ සභාපති.

නිවැරදි බවට සහතික කරමි.

ඒ. ඇම්. සෝමපාල,
ලුණුගල සුළු නගර සභාවේ අංක 2 කොටසේ සභික.

1973 ජූලි මස 10 වැනි දිනදී මා ඉදිරිපිට ලුණුගලදී සහතික කරන ලදී.

ඇම්. කේ. පබිලිස් අප්පුහාමි,
සුළු නගර සභාවේ උප සභාපති හා සමාදාන විනිශ්චයකාර තැන,
ලුණුගල.

## ලුණුගල සුළු නගර සභාව

### 1972 දෙසැම්බර් 31 වැනි දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශනය

| බැරකම් | රු. ශ. | රු. ශ. | වත්කම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|---|
| තැන්පත්—සාමාන්‍ය ... ... | 3,329 4 | | ආදායම් රැස් කිරීමේ ගිනුම : | | |
| විදුලිය ... ... | 9,079 76 | | දේපල බදු ... ... | 6,636 65 | |
| | | 12,408 80 | වැසිකිලි බදු ... ... | 1,576 58 | |
| රජයේ ආධාර—මංමාවත් ... | 305 58 | | ජල බදු ... ... | 2,012 14 | |
| විවිධ ... | 5,420 75 | | වරෙන්තු ගාස්තු ... ... | 775 25 | |
| | | 5,726 33 | විදුලි ගාස්තු ... ... | 7,539 83 | |
| විවිධ ණය හිමියෝ ... ... | | 10,339 7 | කුලී ... ... | 1,011 0 | |
| විදුලිය ක්ෂය සංචිත ගිනුම ... | | 2,850 0 | | | 19,551 45 |

| බැරකම් | රු. ශ. | රු. ශ. | වත්කම් | රු. ශ. |
|---|---|---|---|---|
| අධිකතා හා ඌණතා ගිණුම (විදුලිය) : | | | | |
| 1972.01.01 දිනට අධිකය | 39,917 8 | | අත්තිකාරම් ... ... ... | 771 0 |
| 1972.01.01 දින සිට ගැලපීම් | 3 0 | | විවිධ ණය ගැතියෝ ... ... ... | 19,455 1 |
| | | 39,920 8 | 1972.12.31 දිනට මුදල් පොත් අනුව මුදල් ශේෂය ... | 43,703 18 |
| 1972.01.01 දින සිට ආදායම ... | 50,975 26 | | | |
| | | 90,895 34 | | |
| 1972.01.01 දින සිට වියදම ... | 49,339 66 | | | |
| | | 41,555 68 | | |
| අධිකතා හා ඌණතා ගිණුම (සාමාන්‍ය) : | | | | |
| 1972.01.01 දිනට අධිකය ... | 5,181 15 | | | |
| 1972.01.01 දින සිට ගැලපීම් ... | 1,002 21 | | | |
| | | 6,183 36 | | |
| 1972.01.01 දින සිට ආදායම ... | 62,971 1 | 69,154 37 | | |
| 1972.01.01 දින සිට වියදම ... | 58,553 61 | | | |
| | | 10,600 76 | | |
| | | 83,480 64 | | 83,480 64 |

ලුණුගල සුළු නගර සභාවේ සභාපති දේවසිංහගේ වියුජින් දයානන්ද වීරසේකර වන මම, මගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට **ඉහත සඳහන්ව** ඇති **ලුණුගල සුළු** නගර සභාවේ 1972 වර්ෂයේ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය සැබෑ හා නිවැරදිවූවක් බැව් මෙයින් සහතික කරමි.

ඩී. වී. ඩී. වීරසේකර,
ලුණුගල සුළු නගර සභාවේ සභාපති.

නිවැරදි බවට සහතික කරමි.

ඒ. ඇම්. සෝමපාල,
ලුණුගල සුළු නගර සභාවේ අංක 2 දරණ කොට්ඨාසයේ සභික.

1973 ජුලි මස 10 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඇම්. කේ. පබිලිස් අප්පුහාමි,
සුළු නගර සභාවේ උප සභාපති හා සමාදාන විනිශ්චයකාර තැනැ
ලුණුගල.

8-259/2—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

**කුලියාපිටිය නගර සභාව**

1970 ආදායම් හා වියදම් ප්‍රකාශය

| ආදායම් | රු. ශ. | වියදම | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම් ... ... | 1,38,037 70 | ඒ.—සාමාන්‍ය වියදම් ... ... | 79,779 59 |
| බී.—මහාමාර්ග ... ... ... | 885 33 | බී.—මහා මාර්ග ... ... ... | 46,857 91 |
| සී.—තානායම් ... ... ... | 7,219 01 | සී.—තානායම් ... ... ... | 11,775 60 |
| ඩී.—නගරසභා ඉඩම් හා ගොඩනැගිලි ... ... | 12,379 08 | ඩී.—නගරසභා ඉඩම් හා ගොඩනැගිලි ... ... | 30,381 49 |
| ඊ.—මහජන සෞඛ්‍යය ... ... | 1,34,767 69 | ඊ.—මහජන සෞඛ්‍යය ... ... | 2,16,481 33 |
| එෆ්.—මහජන විනෝදය ... ... | 25,758 40 | එෆ්.—මහජන විනෝදය ... ... | 2,129 90 |
| ජී.—සොහොන්බිම ... ... ... | 342 50 | ජී.—සොහොන්බිම ... ... ... | 2,079 65 |
| එච්.—සුනඛයින් ලියාපදිංචිකිරීම ... ... | 110 50 | එච්.—සුනඛයින් ලියාපදිංචි කිරීම ... ... | 690 0 |
| අයි.—කිරුම් හා මිණුම් ... ... | 1,887 0 | අයි.—කිරුම් හා මිණුම් ... ... | 1,151 56 |
| ජේ.—විදුලිබල කාර්යාංශය ... ... | 2,44,695 15 | ජේ.—විදුලිබල කාර්යාංශය ... ... | 1,88,467 40 |
| ඇම්.—කියවීම්ශාලා හා පුස්තකාල ... ... | 46 35 | කේ.—ගින්නෙන් ආරක්ෂාව ... ... | 37 0 |
| ඇන්.—කිරි වෙළඳාම ... ... | 29,355 58 | ඇම්.—කියවීම්ශාලා හා පුස්තකාල ... ... | 9,406 55 |
| | | ඇන්.—කිරි වෙළඳාම ... ... | 25,771 30 |
| | 5,95,484 29 | | |
| | | | 6,15,009 28 |
| තැන්පත් ... ... ... | 1,63,202 07 | තැන්පත් ... ... ... | 1,63,931 75 |
| අත්තිකාරම් ... ... ... | 13,274 49 | අත්තිකාරම් ... ... ... | 13,133 53 |
| තානායම් ආධාර ... ... ... | 7,500 0 | තානායම් ආධාර ... ... ... | 8,832 34 |
| පුස්තකාල ආධාර ... ... ... | 750 0 | පුස්තකාල ආධාර ... ... ... | 1,380 0 |
| විදුලිය වච්නාකම අඩුවීම ... ... | 1,000 0 | | |
| එකතුව ... | 7,81,210 85 | එකතුව ... | 8,02,286 90 |
| 1969.12.31 දිනට ඉතිරි ... ... | 59,652 65 | 1970.12.31 දිනට ඉතිරි ... ... | 38,576 60 |
| | 8,40,863 50 | | 8,40,863 50 |

කුලියාපිටියේ නගරසාභාවේ 1970 දෙසැම්බර් 31 වැනි දිනට ඇති පූර්වොක්ත ආදායම් හා වියදම් ප්‍රකාශය, කුලියාපිටිය නගරසභාවේ සභාපති වන මම, මගේ උසස්ම දැනීමේ හා විශ්වාසයේ අන්දමට නිවැරදි හා සත්‍ය ප්‍රකාශයක් බව මෙයින් සහතික කරමි.

ලයනල් ජයතිලක,
කුලියාපිටිය නගර සභාවේ සභාපති.

1971 අප්‍රේල් මස 26 වෙනි දින,
කුලියාපිටිය නගරසභා කාර්යාලයේ දී ය.

නිවැරදි බවට සහතික කරමි.

වෙන්සස් පීරිස්,
කුලියාපිටිය නගර සභාවේ නියෝජිත.

1971 ක් වූ අප්‍රේල් මස 26 වෙනි දින කුලියාපිටියේදී මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඒ. ඇම්. පී. අර්ථනායක,
සමාදාන විනිශ්චයකාර.

## කුලියාපිටිය නගර සභාව

1970 දෙසැම්බර් 31 වැනි දිනට දක්වෙන වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

**බැරකම්**

| බැරකම් | රු. ශ. |
|---|---|
| තැන්පත් ... ... | 73,647 53 |
| ත්‍යාගයම් ආධාර ... ... ... | — |
| පුස්තකාල ආධාර ... ... ... | 1,345 87 |
| ක්‍රීඩාභූමි විශේෂ ආධාර ... ... | 1,083 52 |
| විදුලි අංශයේ අගය අඩුවීම ... ... | 16,000 0 |
| | 92,076 92 |

**වත්කම්**

| වත්කම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අත්තිකාරම් ... ... | | | 15,231 30 |
| නිලධාරි ඇප ... ... | | | 1,000 0 |
| විදුලිය දෙපාර්තමේන්තුවේ සංචිත තැන්පත් | | | 16,000 0 |
| බැංකුවේ හා අතේ ඉතිරි ... | | | 38,576 60 |
| 69.12.31 දක්වා ඌණතාවය ... | | 1,744 03 | |
| 70.12.31 දිනට වැය ... | 6,15,009 28 | | |
| 70.12.31 දිනට අය ... | 5,95,484 29 | | |
| | | 19,524 99 | |
| | | | 21,269 02 |
| | | | 92,076 92 |

කුලියාපිටිය නගර සභාවේ සභාපති ලයනල් ජයතිලක වන මම, ඉහත සඳහන් 1970 දෙසැම්බර් මස 31 වැනි දිනට දක්වෙන කුලියාපිටිය නගර සභාවේ වත්කම් හා බැරකම් ප්‍රකාශය, මගේ උසස් ම දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

ලයනල් ජයතිලක,
කුලියාපිටිය නගර සභාවේ සභාපති.

සත්‍ය බවට සහතික කරමි.

වෙන්සස් පීරිස්,
කුලියාපිටිය නගරසභාවේ නියෝජිත.

1971 අප්‍රේල් මස 26 වැනි දින දී මා ඉදිරිපිටදී සහතික කරන ලදි.

ඒ. ඇම්. පී. අර්ථනායක,
සමාදාන විනිශ්චයකාර තැන.

නගරසභා කාර්යාලය,
කුලියාපිටිය. 71.04.26.

8-56—73.08.03. දින අංක 71 දරන ගැසට් පත්‍රය

---

## රඹුක්කන විශේෂ කොමසාරිස් කාර්යාලය

1972 දෙසැම්බර් මාසයේ 31 වැනි දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය

**බැරකම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|
| තැන්පත්—සාමාන්‍ය : | | | | |
| 1. වරිපනම් ... | 158 16 | | | |
| 2. කොන්ත්‍රාත් ඇප ... | 2,543 82 | | | |
| 3. නගරසභා ගොඩනැ-නැගිලි | 12,843 60 | | | |
| 4. තාවකාලික මඩු ... | 320 0 | | | |
| 5. ටෙන්ඩර් ඇප ... | 7,383 0 | | | |
| 6. පුස්තකාල ඇප ... | 1,375 50 | | | |
| 7. නගරසභා නිවාස ... | 1,035 0 | | | |
| 8. විනෝද බදු ... | 800 0 | | | |
| 9. මිශ්‍ර ඇප ... | 1,789 21 | | | |
| | | 28,248 29 | | |
| විදුලි : | | | | |
| 1. නව සේවා ... | 8,173 77 | | | |
| 2. පාරිභෝගික ඇප ... | 15,583 96 | | | |
| 3. ටෙන්ඩර් ඇප ... | 460 0 | | | |
| | | 24,217 73 | | 52,466 02 |
| රජයේ ආධාර : | | | | |
| 1. මුඩුක්කුසංහාරය ... | 13,721 75 | | | |
| 2. ක්‍රීඩා භූමි ... | 2,687 0 | | | |
| 3. පාරවල් ... | 9,361 71 | | | |
| | | | | 30,770 46 |
| ණය-නිවාස ක්‍රමය ... | | | | 629 30 |
| ණය-විදුලි දෙපාර්තමේන්තුව | | | | 49 44 |
| විවිධ ණය හිමියන් ... | | | | 52,364 45 |
| ක්ෂයවීම් සඳහා වෙන්කිරීම | | | | 4,500 0 |
| සාමාන්‍ය අංශය : | | | | |
| 1972.1.1 දිනට අතිරික්තය | 13,032 15 | | | |
| සකස්කිරීම් (බැර) ... | 4,601 09 | | | |
| | | 17,633 24 | | |
| සකස්කිරීම් (හර) ... | | 390 30 | | |
| | | | 17,242 94 | |
| 1972 වර්ෂයේ ආදායම ... | 2,39,247 95 | | | |
| 1972 වර්ෂයේ වියදම ... | 1,87,871 57 | | | |
| | | | 51,376 38 | |
| | | | | 68,619 32 |
| | | | | 2,09,398 99 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අත්තිකාරම් ... | | | 6,183 35 |
| විවිධ ණය කරුවන් ... | | | 58,563 49 |
| වරිපනම් ... | | | 6,156 49 |
| කසළශෝධන බදු ... | | | 1,337 47 |
| කුලී ... | | | 5,309 13 |
| වරෙන්තු ගාස්තු ... | | | 440 41 |
| විදුලිගාස්තු ... | | | 17,298 27 |
| විදුලි දෙපාර්තමේන්තුව | | | |
| 1972.1.1 දිනට ඌණතාවය | | 61,444 52 | |
| 1972 වර්ෂයේ ආදායම ... | 1,06,983 93 | | |
| 1972 වර්ෂයේ වියදම ... | 95,438 28 | | |
| | | 11,545 65 | |
| | | | 49,898 87 |
| මුදල් ඉතිරිය : | | | |
| සාමාන්‍ය ... | 45,239 49 | | |
| විදුලිය ... | 18,962 02 | | |
| | | | 64,201 51 |
| | | | 2,09,398 99 |

රඹුක්කන නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් ඩබ්ලිව්. ඩී. සෝමතුංග වන මම මගේ විශ්වාසයේ සහ දැනීමේ හැටියටඉහත සඳහන්ව ඇති 1972 දෙසැම්බර් මස 31 වැනි දිනට රඹුක්කන සුළු නගරසභාවේ වත්කම් හා බැරකම් ප්‍රකාශය සැබෑවූවක් බව මෙයින් සහතිකකරමි.

ඩබ්ලිව්. ඩී. සෝමතුංග,
රඹුක්කන නගරයේ විශේෂ කොමසාරිස්.

නිවැරදි බවට සහතික කරමි

ඩී. ඇස්. රත්නායක,
ලේකම්.

1973.3.16 වැනි දින රඹුක්කනදී මා ඉදිරිපිට සහතික කරන ලදී.

ඒ. ඇම්. ඒ. රාෂික්,
සාමදාන විනිශ්චයකාර තැන.

රඹුක්කන විශේෂ කොමසාරිස් කාර්යාලය

1972 වර්ෂයේ ආදායම් හා වියදම් ප්‍රකාශය

| ආදායම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම් ... ... | 1,25,263 49 | |
| බී.—මංමාවත් ... ... | 1,209 20 | |
| සී.—නගරසභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 7,901 40 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... | 94,770 06 | |
| ඊ.—මහජන විනෝදය ... ... | 9,543 80 | |
| ඇෆ්.—සුසානභූමි ... ... | 55 0 | |
| ජී.—බල්ලන් ලියාපදිංචිකිරීම ... | 5 0 | |
| ජේ.—කියවීම්ශාලා හා පුස්තකාල ... | 500 0 | |
| | | 2,39,247 95 |

| වියදම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් ... ... | 49,248 59 | |
| බී.—මංමාවත් ... ... | 22,060 55 | |
| සී.—නගරසභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 11,278 15 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... | 97,437 34 | |
| ඊ.—මහජන විනෝදය ... ... | 1,394 0 | |
| ඇෆ්.—සුසානභූමි ... ... | 1,906 80 | |
| ජී.—බල්ලන් විනාශ කිරීම ... | 68 0 | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල ... | 4,478 14 | |
| ... | | 1,87,871 57 |

වෙනත් ලැබීම්

| | |
|---|---|
| කැන්පත් ... ... | 35,651 76 |
| අත්තිකාරම් ... ... | 6,587 97 |
| විවිධ ණයකරුවන් ... ... | 30,926 04 |
| විවිධ ණය හිමියන් ... ... | 50,364 45 |
| විදුලිය පිළිබඳ ගනුදෙනු ... ... | 1,06,983 93 |
| රජයේ ආධාර ... ... | 15,250 0 |
| දේපොල බදු ... ... | 28,566 73 |
| විදුලි ගාස්තු ... ... | 91,377 47 |
| කුලී ... ... | 59,738 45 |
| වරෙන්තු ගාස්තු ... ... | 1,163 81 |
| වසුරු ශෝධක ගාස්තු ... ... | 5,907 91 |
| ක්ෂයවීම සඳහා ... ... | 500 0 |
| ණය ගිණුම ... ... | 20,000 0 |
| අතිරික්ත හා ඌණතා ගිණුම ... | 4,601 09 |
| 1971.12.31 දිනට ඉතිරි මුදල් ... | 22,493 71 |
| | 7,19,361 27 |

වෙනත්ගෙවීම්

| | |
|---|---|
| කැන්පත් ... ... | 29,298 59 |
| අත්තිකාරම් ... ... | 5,652 32 |
| විවිධ ණයකරුවන් ... ... | 57,943 49 |
| විවිධ ණයහිමියන් ... ... | 49,389 31 |
| විදුලිය පිළිබඳ ගනුදෙනු ... | 95,438 28 |
| රජයේ ආධාර ... ... | 17,323 44 |
| දේපොල බදු ... ... | 31,121 88 |
| විදුලි ගාස්තු ... ... | 93,137 51 |
| කුලී ... ... | 58,949 48 |
| වරෙන්තු ගාස්තු ... ... | 1,398 21 |
| වසුරු ශෝධක ගාස්තු... ... | 7,245 38 |
| ණය ගිණුම ... ... | 20,000 0 |
| අතිරික්ත හා ඌණතා ගිණුම ... | 390 30 |
| 1972.12.31 වැනි දිනට ඉතිරි මුදල් ... | 64,201 51 |
| | 7,19,361 27 |

රඹුක්කන නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් ඩබ්ලිව්. ඩී. සෝමතුංග වන මම මගේ විශ්වාසයේ සහ දැනීමේ හැටියට ඉහත සඳහන්ව ඇති 1972 වර්ෂයේ ආදායම් හා වියදම් ප්‍රකාශය නිවැරදි හා සත්‍ය ප්‍රකාශයක් බව මෙයින් සහතිකව ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ඩී. සෝමතුංග,
විශේෂ කොමසාරිස්-රඹුක්කන නගරය.

නිවැරදි බවට සහතික කරමි.

ඩී. ඇස්. රත්නායක,
ලේකම්.

1973.3.16 දින රඹුක්කනදී මා ඉදිරිපිට සහතික කරන ලදී.

ඒ. ඇම්. ඒ. රාෂික්,
සාමදාන විනිශ්චයකාර තැන.

8–76—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

## පානදුර නගර සභාව

### මුදල් රෙගුලාසි 12 (II) යටතේ කෙරෙන අයදුම්පත අංක 1—1973

පහත සඳහන් පරිදි මුදල් ඉතිරිවේයයි ගණන්බලා ඇති වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල් ඊට අනුරූපව දක්වෙන මුදල් වැඩිපුර වියදම් වේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂවල සඳහන් මුදල් පියවා ගැනීම සඳහා මාරුකර 1973 වර්ෂයේ අයවැය ලේඛනයේ වෙනස් කිරීම 1973.02.15 සහ 1973.03.15 දිනවල පැවැත්වුන පානදුර නගර සභා රැස්වීම් වලදී පිළිවලින් අංක 8 (2) සහ 14 (4) දරණ යෝජනා වලින් සම්මතකර ගන්නා ලදී.

| මුදල් ඉතිරි වේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂ | රු. | ශ. | මුදල් වැඩිපුර වියදම් වේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|---|---|---|
| බි.—මහ මාර්ග :— | | | බී.—මහ මාර්ග :— | | |
| (8) සංවර්ධන කටයුතු ... ... ... | 2,000 | 0 | (7) සතුකොට ගැනීම ... ... ... | 2,000 | 0 |
| රි.—මහජන සෞඛ්‍යය :— | | | ඊ.—මහජන සෞඛ්‍යය :— | | |
| (7) වෙළඳ පොලවල් සහ ගාල්— | | | (7) වෙළඳ පොලවල් සහ ගාල්— | | |
| (බි) නඩත්තු කිරීම ... ... ... | 1,000 | 0 | (ඩී) ඉදිකිරීම් ... ... ... | 1,000 | 0 |
| | 3,000 | 0 | | 3,000 | 0 |

ටයිටස් ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව.

නගර සභා කාර්යාලයය,
පානදුර, 1973.07.20.

8-54/1—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## පානදුර නගර සභාව

### අතිරේක අයවැය ලේඛනය අංක 1—1973

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. | යෝජනා අංකය සහ දිනය |
|---|---|---|---|
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | | |
| (10) සතුකොට ගැනීම ... ... | 6,800 | 0 | 1973.02.15 දින අංක 8 (1) |

ටයිටස් ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව.

නගර සභා කාර්යාලය,
පානදුර. 1973.07.20.

8-54/2—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## කැකිරාව නගරයේ සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම (1973-1976)

### විදුලි යෝජනා

ප්‍රාදේශීය සහකාර ප.පා.කො. කොට්ඨාශය — අනුරාධපුරය.
මැතිවරණ කොට්ඨාශය — කැකිරාව.
පළාත් ආණ්ඩුසභාව — විශේෂ කොමසාරිස් කාර්යාලය, කැකිරාව නගරය.
පළාත් ආණ්ඩුසභාවේ ශ්‍රෙණිය — 3 වන ශ්‍රේණියේ සුළු නගර සභාව.

| | 1973 රු. ශ. | 1974 රු. ශ. | 1975 රු. ශ. | 1976 රු. ශ. | වෙනත්කරුණු |
|---|---|---|---|---|---|
| 1.—යන්ත්‍ර සහ උපකරණ සඳහා ආයෝජනයන්— | | | | | |
| (ඒ) විදුලිය නිපදවීමේ යන්ත්‍ර ... ... | — | — | — | — | 1. මරදන්කඩවල පාරේ 59 |
| (බි) රථ වාහන ... ... ... | — | — | — | — | සැතපුම් කණුව අසල උප |
| (සි) ආයුධ ... ... ... | — | — | — | — | ජවපොලක් පිහිටුවීම සඳහා. |
| 2.—උප මධ්‍යස්ථාන දියුණු කිරීම ... ... | — | — | — | — | 2. 1974 වර්ෂය වෙනුවෙන් |
| 3.—අළුත් උප මධ්‍යස්ථාන ... ... | — | — | — | — | පෙන්වා ඇති වැය සඳහා ලෝ |
| 4.—විදුලිය බෙදා හැරීමේ මාර්ග දියුණු කිරීම ... | — | 20,000 0(1) | — | 2,000 0... | ණ.ස.අ. ණයක් ලබාගැනීමට |
| 5.—විදුලිය බෙදාහැරීමේ මාර්ග දීර්ඝ කිරීම ... | — | 40,600 0(2) | 10,000 0... | 50,000 03... | කටයුතු කරගෙන යනු ඇත. |
| 6.—ගොඩනැගිලි ... ... | — | — | — | — | 3. 1976 වර්ෂයේ ණය මුදලක් ලබාගෙන කටයුතු කිරීමට අද හස් කර ඇත. |
| එකතුව ... | — | 60,600 0 | 10,000 0 | 52,000 0 | |

පාලන නිලධාරී,
කැකිරාව සුළු නගර සභාව.

1973 ජූලි මස 24 වැනි දින,
කැකිරාව සුළු නගරසභා කාර්යාලයේදීය.

8-339—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

### හොරණ නගර සභාව

1973 වර්ෂයේ අය වැය ලේඛනය—සාමාන්‍ය අංශය

**වැය ලේඛන අංක 1**

අතිරේක වැය—1973

1973 ජූලි මස 07 වැනි දින හොරණ නගර සභා කාර්යාලයේදී පැවැත්වුන නගර සභා මාසික සභා රැස්වීමේදී පහත දැක්වෙන අතිරේක වැය ලේඛනය ඒකමතිකව සභා සම්මත විය—:

| | | රු. | ශ. |
|---|---|---|---|
| යෝ. 2(6) : | ඒ.—(1) (ඊ) නිලධාරි වැටුප් (විශ්‍රාමික) ... | 6,000 | 0 |
| | ඒ.—(1) (ජී) නිලධාරි වැටුප් (විවාහක දීමනා) | 300 | 0 |
| | ඒ.—(2) (කේ) ජීවනාධාර (විශ්‍රාමික) ... | 1,200 | 0 |
| | ඩී.—(4) නගර සභා ඉඩම්/ගොඩනැගිලි නඩත්තුව ... ... | 4,500 | 0 |
| | සී.—(4) තානායම්/අම්බලම් (සංවර්ධනය) ... | 5,000 | 0 |
| | ඊ.—(1) (ඒ) පරීක්ෂකවරු/වින්නඹු මාතාවන් (වැටුප්) ... ... | 2,500 | 0 |
| | ඊ.—(1) (බී) මහජන සෞඛ්‍ය (අමතර දීමනා) | 500 | 0 |
| යෝ. 5(7) : | ඊ.—(7) (බී) වෙළෙඳපලවල්/ගාල් (නඩත්තුව) | 2,303 | 40 |
| | | 22,303 | 40 |

ඩබ්ලිව්. ඇම්. පොන්සේකා,
සභාපති,
හොරණ නගර සභාව.

1973 ජූලි මස 09 වැනි දින,
හොරණ, නගර සභා කාර්යාලයේදීය.

8–25—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### දෙහිඕවිට සුළු නගර සභාව

සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (II) යටතේ අයදුම් පත—2

**1973 වර්ෂයේ අය වැය ලේඛනය**

1973 වර්ෂයේ අය වැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල්, ඊට අනුරූපව ඇති, අතිරේක ප්‍රතිපාදන අවශ්‍යයයි ගණන් බලන ලද වැය ශීර්ෂයන්ට මාරු කර වැය කිරීමට තීරණය කරන ලදී.

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | ඉතිරි මුදල රු. | ශ. |
|---|---|---|
| ඒ.—(2) (ජේ) හදිසි වියදම් ... ... | 108 | 0 |
| එකතුව ... | 108 | 0 |

| මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | අවශ්‍ය මුදල රු. | ශ. |
|---|---|---|
| ඩී.—(5) ජල සම්පාදනය— | | |
| (සී) නඩත්තු කිරීම ... ... ... | 73 | 0 |
| (ඩී) අත්පත්කර ගැනීම ... ... ... | 35 | 0 |
| එකතුව ... | 108 | 0 |

පැරකුම් විජේසිංහ,
පාලන නිලධාරී, දෙහිඕවිට සුළු නගර සභාව.

1973 ජූලි මස 12 දින,
දෙහිඕවිට සුළු නගර සභා කාර්යාලයේ දීය.

අනුමත කරමි.

පැරකුම් විජේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්, කෑගල්ල.

1973 ජූලි 23 දින,
කෑගල්ල පළාත් පාලන කාර්යාලයේ දීය.

8–78—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### ලුණුගල සුළු නගර සභාව

1973 දෙවැනි පරිපූරක අය වැය ලේඛනය

**1 වැනි කොටස—සාමාන්‍ය**

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (එප්) විශ්‍රාම වැටුප් ... ... | 640 | 0 |
| ඩී.—(7) (එප්) වෙළඳපලවල් හා ගාල් සතුකොට ගැනීම ... | 125 | 0 |
| | 765 | 0 |

**2 වැනි කොටස—විදුලිය**

| | රු. | ශ. |
|---|---|---|
| විදු.—(16) අළුත් මාර්ග ඉදි කිරීම හා දීර්ඝ කිරීම ... | 15,000 | 0 |

1973 අප්‍රේල් මස 27 වැනි දින රැස්වීමේ අංක 5 කාරණාව යටතේ සම්මත කරන ලදී.

ඩී. වී. ඩී. වීරසේකර,
සභාපති,
ලුණුගල සුළු නගර සභාව.

1973 ජූනි මස 04 වැනි දින,
ලුණුගල සුළු නගර සභා කාර්යාලයේදී.

අනුමත කරමි.

ටී. අයි. කමාල්දීන්,
ප. පා.ස.කො., බදුල්ල.

1973 ජූලි මස 23 වැනි දින,
බදුල්ල පළාත් පාලන කාර්යාලයේදී.

8–289—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### ලුණුගල සුළු නගර සභාව

1973 පළමුවැනි පරිපූරක අය වැය ලේඛනය

**1 වන කොටස—සාමාන්‍ය**

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. |
|---|---|---|
| ඩී.—(7) (ඩී) පොදු වෙළඳපල ඉදි කිරීම ... ... | 5,500 | 0 |
| ඩී.—(1) (එන්) මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථානය ... | 300 | 0 |

1973 පෙබරවාරි මස 23 වැනි දින රැස්වීමේ අංක 4 යටතේ සම්මත කරන ලදී.

ඩී. වී. ඩී. වීරසේකර,
ලුණුගල සුළු නගර සභාවේ සභාපති.

1973 මාර්තු මස 16 වැනි දින,
ලුණුගල සුළු නගර සභා කාර්යාලයේදී.

අනුමත කරමි.

ටී. අයි. කමාල්දීන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
බදුල්ල.

1973 ජූලි මස 23 වැනි දින,
බදුල්ල පළාත් පාලන කාර්යාලයේදී.

8–290—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

## ලුණුගල සුළු නගර සභාව

සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (II) යටතේ ඉල්ලුම් පත්‍රය

1973 වර්ෂයේ අය වැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදලින් ඉතිරිවේයයි ගණන් බලන පහත පෙනෙණ වැය ශීර්ෂය යටතේ වූ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයට මාරු කර අවශ්‍ය වී ඇති අතිරේක වැය සඳහා එම ශීර්ෂය යටතේ යෙදවීමට 1973.02.23 දින පවත්වන ලද ලුණුගල සුළු නගරසභාවේ මාසික රැස්වීමේ අංක 3 යටතේ සම්මත කරන ලදී.

| මුදල් ඉතිරිවේයැයි අපේක්ෂිත වැය ශීර්ෂය | රු. ශ. | තවදුරටත් මුදල් අවශ්‍ය වැය ශීර්ෂය | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—(1) (බී) ලිපිකරු වැටුප් ... ... | 312 0 | ඒ.—(5) දිළිඳු සිසුන්ට නොමිලයේ පාසැල් පොත් දීම ... | 312 0 |

බී. වී. බී. වීරසේකර,
සභාපති.
ලුණුගල සුළු නගර සභාව.

1973.03.16 දින,
ලුණුගල සුළු නගරසභා කාර්යාලයේදීය.

අනුමත කරමි.

ටී. අයි කමාල්දීන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්, බදුල්ල.

1973.07.23 දින,
බදුල්ල පළාත් පාලන කාර්යාලයේ දී ය.

8-291—73.08.03. දින අංක 71 දරන ගැසට් පත්‍රය

---

## පස්සර නගරය—සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම (1973–1976)

විදුලි යෝජනා

ප්‍රාදේශීය සහකාර ප.පා. කොට්ඨාශය : බදුල්ල
මැතිවරණ කොට්ඨාශය : පස්සර
පළාත් ආණ්ඩු සභාව : පස්සර සුළු නගර සභාව
පළාත් ආණ්ඩු සභාවේ ශ්‍රේණිය : IV වැනි ශ්‍රේණිය

| | 1973 රු. ශ. | 1974 රු. ශ. | 1975 රු. ශ. | 1976 රු. ශ. | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 1. යන්ත්‍ර සහ උපකරණ සඳහා ආයෝජනයන්— | | | | | |
| (ඒ) විදුලිය නිපදවීමේ යන්ත්‍ර ... ... | — ... | — ... | — ... | — ... | |
| (බී) රථවාහන ... ... ... | — ... | — ... | — ... | — ... | |
| (සී) ආයුධ ... ... ... | 100 0... | 1,000 0... | 500 0... | 500 0... | |
| 2.—උප මධ්‍යස්ථාන දියුණු කිරීම ... ... | 2,000 0... | 250 0... | 250 0... | 500 0... | |
| 3.—අලුත් උප මධ්‍යස්ථාන ... ... | — ... | — ... | — ... | — ... | |
| 4.—විදුලිය බෙදා හැරීමේ මාර්ග දියුණු කිරීම ... | 5,000 0... | — ... | 8,000 0... | 10,000 0... | මධකලපු පාර සහ මිශ්‍ර දීර්ඝ කිරීම. |
| 5.—විදුලිය බෙදා හැරීමෙ මාර්ග දීර්ඝ කිරීම ... | 500 0... | 500 0... | 500 0... | 500 0... | |
| 6.—ගොඩනැගිලි ... ... ... | 8,000 0... | — ... | 15,000 0... | 10,000 0... | කම්බිකරුට නිල නිවාසයක් තැනීම සහ විදුලි අධිකාරිට නිල නිවාසයක් තැනීම. |

1973 ජූලි මස 22 වෙනි දින තීරණ අංක 22 යටතේ තීරණය කරන ලදී.

ටී. අයි. කමාල්දීන්,
විශේෂ කොමසාරිස් පස්සර නගරය.

එම්. ජී. සනී,
ලේකම්, පස්සර විශේෂ කොමසාරිස් කාර්යාලය.

8-306—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## මහරගම උප නගර සභාව

1973 වර්ෂයේ 1 වැනි පරිපූරක අය-වැය ලේඛනය

1 වැනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | මුදල රු. ශ. |
|---|---|
| ඒ.—(2) (ඊ) නිතිඥ ගාස්තුව ... ... | 4,000 0 |
| සී.—(4) නඩත්තු කිරීම ... ... ... | 10,000 0 |
| සී.—(5) උපකරණ ... ... ... | 15,000 0 |
| සී.—(7) අළුත් කර්මාන්ත ... ... | 15,000 0 |
| ඩී.—(2) (බී) කරත්ත, හවයින් හා ලොරි ... ... | 2,500 0 |
| එෆ්.—(2) නඩත්තු කිරීම ... ... ... | 200 0 |
| | 46,700 0 |

1973ක්වූ ජූනි මස 29 වැනි දින පැවැති සභා රැස්වීමේදී යෝජනා අංක 22 යටතේ සභා සම්මත විය.

ඊ. ඩී. චන්ද්‍රසේකර,
සභාපති,
මහරගම උප නගර සභාව.

1973 ජූලි මස 23 වැනි දින,
මහරගම උප නගර සභා කාර්යාලයේදීය.

8-301—73.08.03 දින අංක 71 දරන ගැසට් පත්‍රය

## පුස්සැල්ලාව විශේෂ කොමසාරිස් කාර්යාලය

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40(II) යටතේ අයදුම්පත

### 1973 අය වැය ලේඛනය

1973 අය වැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයැයි ගණන් බලන ලද මුදල් ඊට අනුරූපව දක්වෙන අතිරේක ප්‍රතිපාදන අවශ්‍යවේයැයි ගණන් බලා ඇති වැය ශීර්ෂවලට මාරු කර වියදම් කිරීමට තීරණය කරන ලදී.

| මුදල් ඉතිරි වැය ශීර්ෂය | මුදල රු. | ශ. | මුදල් අවශ්‍ය වැය ශීර්ෂය | මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|
| බී.—(2) පාරවල් නඩත්තු කිරීම ... ... | 4,775 | 0 | ඒ.—(1) (එච්) විවාහක දීමනා ... ... | 75 | 0 |
| | | | ඒ.—(2) (බී) ගමන් ගාස්තු ... ... | 1,000 | 0 |
| | | | ඒ.—(2) (එෆ්) ලිපි ද්‍රව්‍ය ආදිය ... ... | 2,000 | 0 |
| | | | ඩී.—(1) (එෆ්) විශබීජ නාශක ද්‍රව්‍ය ... ... | 100 | 0 |
| | | | ඩී.—(2) (සී) ගබඩා ... ... ... | 500 | 0 |
| | | | ඩී.—(3) (සී) ගබඩා ... ... ... | 500 | 0 |
| | | | ඩී.—(5) (බී) උපකරණ ... ... ... | 600 | 0 |
| | 4,775 | 0 | | 4,775 | 0 |

### විදුලිය අංශය

| | රු. | ශ. | | රු. | ශ |
|---|---|---|---|---|---|
| විදු.—(16) ඉදිකිරීම් හා දීර්ඝ කිරීම් ... ... | 1,500 | 0 | 3.—(ජේ) ලිපි ද්‍රව්‍ය ආදිය ... ... | 500 | 0 |
| | | | 5.—(බී) මීටර් හා උපකරණ ... ... | 1,000 | 0 |
| | 1,500 | 0 | | 1,500 | 0 |

එල්. ජී. ඩී. පෙරේරා,
විශේෂ කොමසාරිස්,
පුස්සැල්ලාව නගරය.

1973 ජූලි මස 19 දින,
පුස්සැල්ලාව,
විශේෂ කොමසාරිස් කාර්යාලයය.

8–308—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## මතුගම සුලු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ අයදුම් පත්‍රය

### 1973 අයවැය ලේඛනය

1973 වර්ෂයේ වැය සම්මතයන්ගෙන් ඉතිරි වේයයි ගණන් බලන ලද පහත සඳහන් මුදල් අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක වැය පියවා ගැනීම සඳහා පහත දක්වා ඇති පරිදි යෙදවීමට 1973.06.29 වැනි දින පවත්වන ලද මතුගම සුළු නගර සභාවේ මාසික රැස්වීමේදී අංක 5(II)දරණ යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත කරණ ලදී.

### විදුලිය අය වැය ලේඛනය

| ඉතිරි මුදල | රු. | ශ. | අතිරේක ප්‍රතිපාදන | රු. | ශ. |
|---|---|---|---|---|---|
| විදුලිය (1) (ඒ) විදුලි ගාස්තු ... ... | 4,980 | 0 | විදුලිය (9) විදුලි බල උප පොල ... ... | 15,000 | 0 |
| විදුලිය (1) (බී) උපරිම අවශ්‍යතා ගාස්තු ... ... | 4,000 | 0 | | | |
| විදුලිය (3) (සී) අතිකාල දීමනා ... ... | 100 | 0 | | | |
| විදුලිය (3) (එෆ්) නිළ ඇඳුම් ... ... | 420 | 0 | | | |
| විදුලිය (3) (එල්) නීතිඥ ගාස්තු ... ... | 500 | 0 | | | |
| විදුලිය (3) (කිව්) විවිධ වියදම් ... ... | 1,000 | 0 | | | |
| විදුලිය (4) (ඒ) වැටුප් හා වේතන ... ... | 2,000 | 0 | | | |
| විදුලිය (5) (ඒ) ගොඩනැගිලි ... ... | 500 | 0 | | | |
| විදුලිය (5) (සී) වාහන ... ... ... | 500 | 0 | | | |
| **දෙවන කොටස** | | | | | |
| විදුලිය (11) ගොඩනැගිලි ... ... | 500 | 0 | | | |
| විදුලිය (13) ලී බඩු හා කාර්යාලීය උපකරන ... | 500 | 0 | | | |
| | 15,000 | 0 | | 15,000 | 0 |

එස්. පස්කුවල්,
සභාපති,
මතුගම සුළු නගර සභාව.

1973 ජූලි මස 3 වැනි දින,
මතුගම සුළු නගර සභා කාර්යාලයේ දිය.

අනුමත කරමි.

මගේ අංකය : ක/ඊ/11/2/1
1973.07.20.

ලී. ජෝ. එ. වික්‍රමසේකර,
පළාත් පාලන සහකාර කොමසාරිස්.
කළුතර.

8–53—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

## රඹුක්කන සුළු නගර සභාව

### විදුලිය අය-වැය ලේඛනය

### 1 වන කොටස—ආදායම

| ආදායම | රු. | ශ. | එකතුව රු. | ශ. |
|---|---|---|---|---|
| 1. විදුලි බලය විකිණීම— | | | | |
| (ඒ) පාවිච්චි කරණ ලද විදුලිය ... | 87,000 | 0 | | |
| (බී) මීටර් කුලිය සහ ස්ථාවර ගාස්තු ... | 3,800 | 0 | | |
| (සී) වීථි ආලෝක කිරීම ... | 8,775 | 0 | | |
| (ඩී) තාවකාලික සැරසිලි ගාස්තු :— | | | | |
| (i) සවිකර ඇති මීටරයකින් ... | 400 | 0 | | |
| (ii) වෙනත් මීටරයක් සවි කිරීම ... | 500 | 0 | | |
| | | | 1,00,475 | 0 |
| 2. පාරිභෝගිකයන් සඳහා ක්‍රියාවේ යෙදවූ කර්මාන්ත— | | | | |
| (ඒ) නව සේවා පිරිද්දුම් ගාස්තු ... | 5,000 | 0 | | |
| (බී) වෙනත් වැඩ ... ... | 100 | 0 | | |
| | | | 5,100 | 0 |
| 3. විවිධ— | | | | |
| (ඒ) විවිධ අය කිරීම් ... ... | 750 | 0 | | |
| (බී) ආයෝජන, ණය ආදියෙන් ලැබෙන පොලිය ... ... | — | | | |
| (සී) සේවයට අයෝග්‍ය ගබඩා බඩු විකිණීම | 25 | 0 | | |
| (ඩී) දඩ මුදල් ... ... | 25 | 0 | | |
| | | | 800 | 0 |
| 4. රජයේ ආධාර— | | | | |
| (ඒ) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර දීමනා සහ අතුරු දීමනා ... | 8,000 | 0 | | |
| | | | 8,000 | 0 |
| | | | 1,14,375 | 0 |

| වියදම | රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| 1. තොග වශයෙන් මිලදී ගැනීම— | | | | |
| (ඒ) විදුලිය ගාස්තු ... ... | 32,000 | 0 | | |
| (බී) උපරිම අවශ්‍යතා ගාස්තු ... | 15,500 | 0 | | |
| | | | 47,500 | 0 |
| 2. විදුලි බලය ඉපයීම— | | | | |
| (ඒ) ඉන්දන : | | | | |
| (i) සෘජු ද්‍රව්‍ය ... ... | — | | | |
| (ii) වක්‍ර ද්‍රව්‍ය ... ... | — | | | |
| (බී) වැටුප් සහ වේතන ... | — | | | |
| (සී) විවාහ දීමනා ... ... | — | | | |
| (ඩී) අතිකාල දීමනා ... ... | — | | | |
| (ඊ) අනතුරු දීමනා ... ... | — | | | |
| (ඇෆ්) කම්කරු වන්දි මුදල් ... | — | | | |
| (ජී) විදුලිබල යන්ත්‍ර නඩත්තු කිරීම ... | — | | | |
| (එච්) විවිධ වියදම් ... ... | — | | | |
| | | | — | |
| 3. පාලනය සහ සාමාන්‍ය වියදම්— | | | | |
| (ඒ) වැටුප් සහ වේතන ... | 8,412 | 0 | | |
| (බී) විවාහ දීමනා ... ... | 810 | 0 | | |
| (සී) අතිකාල දීමනා ... ... | 50 | 0 | | |
| (ඩී) අනතුරු දීමනා ... ... | 370 | 0 | | |
| (ඊ) ගමන් ගාස්තු වියදම් ... | 500 | 0 | | |
| (ඇෆ්) නිල ඇඳුම් ... ... | 350 | 0 | | |
| (ජී) නිදහස් දුම්රිය බලපත්‍ර ... | 500 | 0 | | |
| (එච්) විශ්‍රාම වැටුප්, පාරිතෝෂික මුදල් සහ අර්ථ සාදක අරමුදලට දයක මුදල ... ... | 150 | 0 | | |
| (අයි) ලබන සේවාවන් වෙනුවෙන් සාමාන්‍ය අංශයට දෙන දයක මුදල ... | 6,750 | 0 | | |
| (ජේ) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ ගාස්තු, ප්‍රචාරක වියදම් සහ කාර්යාලීය වෙනත් වියදම් ... ... | 500 | 0 | | |
| (කේ) බැංකු ගාස්තු ... ... | 100 | 0 | | |
| (එල්) නීතිඥ ගාස්තු ... | 100 | 0 | | |
| (එම්) ගණන් පරීක්ෂක ගාස්තු ... | 800 | 0 | | |
| (එන්) ණය සඳහා පොලී ... | 3,900 | 0 | | |
| (ඕ) රක්ෂණ ගාස්තු ... ... | — | | | |
| (පී) පාරිභෝගිකයින්ට වන්දි මුදල් ... | — | | | |
| (කිව්) විවිධ වියදම් ... ... | 750 | 0 | | |
| | | | 24,042 | 0 |
| 4. විදුලි බලය බෙදා හැරීම— | | | | |
| (ඒ) වැටුප් සහ වේතන ... | 9,500 | 0 | | |
| (බී) විවාහ දීමනා ... ... | 210 | 0 | | |
| (සී) අතිකාල දීමනා ... ... | 50 | 0 | | |
| (ඩී) අනතුරු දීමනා ... ... | 310 | 0 | | |
| (ඊ) කම්කරු වන්දි මුදල් ... | — | | | |
| (ඇෆ්) විවිධ ගාස්තු ... ... | — | | | |
| | | | 10,070 | 0 |
| 5. නඩත්තු හා අළුත් වැඩියා කිරීම— | | | | |
| (ඒ) ගොඩනැගිලි ... ... | 1,000 | 0 | | |
| (බී) මීටර් සහ අනිකුත් උපකරණ ... | — | | | |
| (සී) වාහන ... ... | — | | | |
| (ඩී) විවිධ ගාස්තු ... ... | — | | | |
| | | | 1,000 | 0 |
| 6. පාරිභෝගිකයන් සඳහා ක්‍රියාවේ යෙදවූ කර්මාන්ත— | | | | |
| (ඒ) ද්‍රව්‍ය :— | | | | |
| (i) නව සේවා පිරිද්දුම් සඳහා ... | 3,000 | 0 | | |
| (ii) නඩත්තු කිරීම් සඳහා ... | 2,000 | 0 | | |
| (බී) කම්කරු ගාස්තු :— | | | | |
| (i) තාවකාලිකව ... | 100 | 0 | | |
| | | | 5,100 | 0 |
| 7. ක්ෂයවීම— | | | | |
| (ඒ) විදුලිබල යන්ත්‍ර සූත්‍ර ... | — | | | |
| (බී) වාහන ... ... | — | | | |
| (සී) ගොඩනැගිලි ... ... | — | | | |
| (ඩී) ලි බඩු සහ කාර්යාලීය උපකරණ | — | | | |
| (ඊ) ආයුධ ... ... | — | | | |
| | | | — | |
| එකතුව ... | | | 87,712 | 0 |
| ප්‍රාග් ධන වියදම් ... | | | 26,000 | 0 |
| අතිරික්තය ... | | | 663 | 0 |
| මුළු එකතුව ... | | | 1,14,375 | 0 |
| 8. ණය මුදල් ආපසු ගෙවීම් | | | | |
| (ඒ) මුල් මුදල ... ... | 14,500 | 0 | | |
| 9. විදුලිබල උප මධ්‍යස්ථාන ... | 1,000 | 0 | | |
| 10. විදුලි බල යන්ත්‍ර ... ... | — | | | |
| 11. ගොඩනැගිලි ... ... | — | | | |
| 12. වාහන ... ... | — | | | |
| 13. ලි බඩු සහ කාර්යාලීය උපකරණ ... | — | | | |
| 14. ආයුධ ... ... | 750 | 0 | | |
| 15. වීථි ආලෝක කිරීම ... | 3,250 | 0 | | |
| 16. අලුත් විදුලි මාර්ග ඉදි කිරීම හා දීර්ඝ කිරීම | 5,500 | 0 | | |
| 17. ඉඩම් හා ගස් කැපීම් සඳහා වන්දි මුදල් ... | 1,000 | 0 | | |
| | | | 26,000 | 0 |
| | | | 26,000 | 0 |

1972 නොවැම්බර් මස 15 වෙනි දින අංක 3 දරණ තීරණයෙන් සම්මත කරණ ලදී.

ඩබ්ලිව්. ඩී. සෝමතුංග,
විශේෂ කොමසාරිස්,
රඹුක්කන නගරය.

1972 නොවැම්බර් මස 15 දින,
රඹුක්කන විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

8–298—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

### නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව

මුදල් රෙගුලාසි 12 (ii) යටතේ අයදුම් පත

1972 අය-වැය ලේඛනය

1972 වර්ෂයේ අය-වැය ලේඛනයේ වැය ශීර්ෂයන්ගෙන් ඉතිරිවේයයි ගණන් බලා ඇති මුදල්, වැය ඉක්මවයයි ගණන් බලා ඇති ශීර්ෂයන්ට මාරු කළ යුතුයයි සම්මත කරමි.

| මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති ශීර්ෂ | රු. | ශ. | වැය ඉක්මවායයි ගණන් බලා ඇති ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—(1) (බී) ... | 8,000 | 0 | ඒ.—(2) (ඇfජ) ... | 1,200 | 0 |
| බී.—(7) ... | 910 | 0 | බී.—(4) ... | 2,910 | 0 |
| | | | ඩී.—(8) ... | 790 | 0 |
| | | | ඊ.—(2) (බී) ... | 1,085 | 0 |
| | | | ඊ.—(3) (ඒ) ... | 1,680 | 0 |
| | | | ඊ.—(3) (බී) ... | 500 | 0 |
| | | | ඊ.—(5) (සී) ... | 200 | 0 |
| | | | ජී.—(1) ... | 200 | 0 |
| | | | ඇම්.—(1) ... | 345 | 0 |
| | 8,910 | 0 | | 8,910 | 0 |

විදුලි අංශය—II කොටස

| | රු. | ශ. | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ජේ.—(6) ... | 5,900 | 0 | ජේ.—(2) (සී) ... | 1,550 | 0 |
| | | | ජේ.—(3) (ඒ) ... | 4,350 | 0 |
| | 5,900 | 0 | | 5,900 | 0 |

ඩබ්ලිව්. ඒ. ඊ. පීරිස්,
නාවලපිටිය නගරයේ විශේෂ කොමසාරිස්.

1972 දෙසැම්බර් මස 16 වැනි දින,
නාවලපිටිය නගරයේ විශේෂ කොමසාරිස් කායර්‍යාලයේදීය.

8-55/1—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව

1972–73 වෙනි පරිපූරක අය-වැය ලේඛනය

විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| ජේ.—(1) (ඒ) ... | 24,400 | 0 |

ඩබ්ලිව්. ඒ. ඊ. පීරිස්,
නාවලපිටිය නගරයේ විශේෂ කොමසාරිස්.

1972 දෙසැම්බර් මස 16 වෙනි දින,
විශේෂ කොමසාරිස් කායර්‍යාලයේදීය.

8-55/2—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

### රක්වාන සුලු නගර සභාව

සුලු නගර සභා මුදල් රෙගුලාසි 40(II) යටතේ කෙරෙන පළමුවැනි අයදුම් පත්‍රයයි

1973 වර්ෂයේ අය වැය ලේඛනයේ පහත සඳහන් ශීර්ෂයන් යටතේ වෙන්කර ඇති මුදලින් ඉතිරිවේයයි ගණන් බලා ඇති මුදල් ඊට අනුරූපව දක්වෙන ශීර්ෂයන්ට මාරුකර, අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා යෙදවීමට 1973 ජූනි මස 29 වැනි දින පවත්වන ලද රක්වාන සුලු නගර සභාවේ මාසික රැස්වීමේ අංක 7 දරණ යෝජනාව අනුව සම්මත කරන ලදී.

I වන කොටස—සාමාන්‍ය

| මුදල් ඉතිරිවන වැය ශීර්ෂය | රු. | ශ. | මුදල් අවශ්‍යව ඇති වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඩී.—(2) (ඒ) වැටුප් ... ... ... | 300 | 0 | ඒ.—(2) (බී) ගමන් ගාස්තු ... ... | 500 | 0 |
| ඩී.—(3) (ඒ) වැටුප් ... ... ... | 350 | 0 | ඩී.—(2) (සී) ගබඩා උපකරණ ... ... | 150 | 0 |
| ඩී.—(3) (ඊ) වැසිකිළි නඩත්තු කිරීම ... ... | 150 | 0 | ඩී.—(3) (සී) ගබඩා උපකරණ ... ... | 150 | 0 |
| | 800 | 0 | | 800 | 0 |

විදුලිය අය වැය ලේඛණය

| | රු. | ශ. | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| 3.—(ඒ) වැටුප් සහ වේතන ... ... | 400 | 0 | 3.—(ඊ) ගමන් වියදම් දීමනා ... ... | 400 | 0 |
| | 400 | 0 | | 400 | 0 |

වී. ටී. ජී. කරුණාරත්න,
සභාපති තැන,
රක්වාන සුලු නගර සභාව

1973 ජූලි 20 වැනි දින,
රක්වාන, සුලු නගර සභා කායර්‍යාලයේ දී.

8-41—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

## විවිධ දැන්වීම්

### නාගොඩ-මාපලගම ගම්සභාව

නාගොඩ-මාපලගම ගම්සභාවේ පොදු මංමාවත්

ගාලු දිස්ත්‍රික්කයේ නාගොඩ මාපලගම ගම්සභා සීමාව තුළ මහජනයා විසින් ප්‍රයෝජනයට ගනු ලබන මෙහි පහත උපලේඛනයේ සඳහන් ගම්සභා පාර 257 වැනි අධිකාරියේ ගම්සභා ආඥපනතේ 42 වැනි වගන්තිය යටතේ ගම්සභා පාරක් වශයෙන් ප්‍රසිද්ධ කරන බැව් මෙයින් නිවේදනය කරමි.

යෝජිත කරුණ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව හෝ අදල ඉඩම් හිමියන් විසින් මෙයට විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධවීමට ඇති හේතු දක්වෙන ලියවිල්ලක් (දෙපිටපතකින් යුතුව) මෙම දැන්වීම රජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත භාර දිය යුතු බවත්, නියමිත කාලය තුළ එවැනි විරුද්ධත්වයක් ඒ පිළිබඳව මා වෙත ඉදිරිපත් නොවිණි නම්, එකී උපලේඛනයේ සඳහන් පාර නාගොඩ මාපලගම ගම්සභාව සතු පොදු දේපල ලෙස පිළිගෙන නාගොඩ-මාපලගම ගම්සභාව මගින් සාද හෝ නැවත සාදගැනීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ පවත්වා ගෙන යනු ලබන බව පොදු මහජනතාවගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරමි.

කේ. ජේ. ඒ. හින්නිඅප්පුහාමි,
සභාපති,
නාගොඩ-මාපලගම ගම්සභාව.

1973 ජූලි මස 16 වැනි දින,
නාගොඩ-මාපලගම ගම්සභාව,
ඇතුමලේ.

උපලේඛනය

| පාරේ නම | ගම්සභා කොට්ඨාශය | දිග | පළල |
|---|---|---|---|
| කනහේන දඹුගහහේන හරහා ඉඳුරුපත්විල පාර | අංක 10–ගෝනලගොඩ | දම්. 65 ... | අඩි 12 |

8-57—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

**මාතලේ නගරය**

පිස්සු බලු උවදුර පිළිබඳ දැන්වීමයි

මාතලේ නගර සීමාව ඇතුළත පිස්සු බලු උවදුර ඇති හෙයින්, පෞද්ගලික ස්ථානයක්, මිදුලක් හෝ වත්තක් හැර වෙන ඕනෑම ප්‍රසිද්ධ ස්ථානයක හෝ මාර්ගයක සිටින්නා වූ බැඳ නොතබන ලද හෝ කෙනෙකු විසින් ගෙන යනු නො ලබන ඕනෑම බල්ලකු, මගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම කෙනෙකු විසින් සැනකින්ම විනාශ කර දැම්මට ජලභීතිකා රෝගය පිළිබඳ ආඥාපනතේ (476 වැනි අධිකාරය) 11 වන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම ප්‍රකාශනය රජයේ ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ දිනයේ සිට මාස 6 කින් අවලංගු වේ.

කේ. එච්. පෙරේරා,
වැඩබලන නාගරික කොමසාරිස්,
මාතලේ.

විශේෂ කොමසාරිස් කාර්යාලය,
මාතලේ නගරය, මාතලේ,
1973 ජූලි මස 24 දින.

8–341—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

**විශේෂ කොමසාරිස් කාර්යාලය**

තංගල්ල නගරය

**1973 වර්ෂයේ තක්සේරු ප්‍රතිශෝධන වරිපනම් බදු පොත්**

තංගල්ල නගරයේ 1973 වර්ෂය සඳහා වූ තක්සේරු ප්‍රතිශෝධන වරිපනම් බදු පොත් දැනට සූදානම් කර අවසාන බවත්, එය කාර්යාලීය වේලාවන් තුලදී පරීක්ෂා කල හැකි බවත්, නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 166 වැනි කොටස සහ නාගරික සභා ආඥා පනතේ (252 අධිකාරය) 235 (1) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

එච්. ජී. ආනන්ද,
විශේෂ කොමසාරිස්, තංගල්ල නගරය.

73. 07. 25.

8–321—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

**විශේෂ කොමසාරිස් කාර්යාලය—අම්බලන්ගොඩ නගරය**

අම්බලන්ගොඩ නගරයේ පාලන සීමාව තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම පාලන සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ස්ථානයක හෝ පාරක හමුවන දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කා ගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියකු )මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවෙලෙහිම විනාශ කරනු ලබන බව (476 වන අධිකාරය) ජලභීතිකා ආඥා පනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම දෙමි.

මෙහි සඳහන් දිනයේ සිට හයමසක් ගතවූ පසු මෙම නිවේදනය අවලංගු වන්නේ ය.

කෝලිත වල්ගමගේ,
විශේෂ කොමසාරිස්, අම්බලන්ගොඩ නගරය.

1973. 07. 16 දින,
අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්යාලයේදීය.

8–9—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

**අකුරැස්ස ගෙවල් කුලී මණ්ඩලය**

දැන්වීමයි

1972 අංක 7 දරණ ගෙවල් කුලී පනතේ කාර්යයන් උදෙසා, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා විසින් අංක 15,011/4 සහ 1972 මැයි මස 20 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, 1972 අංක 7 දරණ ගෙවල් කුලී පනතේ 43 වැනි වගන්තිය සහ 46(2) (ඇ) වැනි වගන්තිය යටතේ සම්පාදිත නියෝගවල අංක 3, දරණ නියෝගය ප්‍රකාර අකුරැස්ස ගෙවල් කුලී මණ්ඩලය වෙත එවිය යුතු සියලුම අයදුම්පත් එවිය යුතු ලිපිනයත්, එම අයදුම්පත් විභාග කිරීම සඳහා මණ්ඩලය රැස්වන ස්ථානයත් මෙහි පහත සඳහන් පරිදි බව මෙයින් නිවේදනය කරමි.

ගෙවල් කුලී මණ්ඩලය,
සුළු නගර සභා කාර්යාලය,
අකුරැස්ස.

කේ. ඩී. ඒ. සද්ධාතිස්ස,
සභාපති,
අකුරැස්ස ගෙවල් කුලී මණ්ඩලය.

1973 ජූලි මස 19 වැනි දින,
අකුරැස්ස සුළු නගර සභා කාර්යාලයේදී.

8–73—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

**ගම්සභා ආඥාපනත (257 අධිකාරය)**

මෙගොඩපොත ගම්සභාව—ඌරාපොල

**ගම්සභාවට අයිති පාරවල්**

මෙගොඩපොත ගම්සභාව විසින් 1960.12.28 වෙනි දින සම්මත කරන ලදුව අංක 12,281 හා 3.2.1961 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ පල කරන ලද යෝජනාව මෙහි පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට 30.08.1973 දින පැවැති මෙගොඩපොත ගම්සභාවේ රැස්වීමේදී අංක 7 දරණ යෝජනාවෙන් තීරණය කළ බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඇම්. ඇස්. ඇස්. රාජකරුණා,
සභාපති,
මෙගොඩපොත ගම්සභාව.

**යෝජනාව :** (ගම්සභාවට අයිති පාරවල් )

මෙගොඩපොත ගම්සභාව විසින් 28.12.1960 වන දින සම්මත කරන ලදුව අංක 12,281 හා 03.02.1961 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ පළ කරන ලද යෝජනාව මෙහි පහත දැක්වෙන පරිදි සංශෝධනය කළ යුතුයයි යනුවෙන් වී. පී. පුංචිසිංඤෝ මයා විසින් කරන ලද යෝජනය ඒ. ඒ. දාවිත් සිංඤෝ මයාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

"1952 අංක 6 දරණ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥා පනතේ 3 වන වගන්තියේ පළමු වන උප වගන්තිය යටතේ මෙගොඩපොත ගම්සභාව විසින් වර්ෂ 1954 ක්වූ ජූලි මස 2 වෙනි දින අංක 10,689 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 4 වෙනි කාණ්ඩයේ පළවෙනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර 1960 ඔක්තෝම්බර් මස 14 වෙනි දින අංක 12,212 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද හා එකී අතුරු ව්‍යවස්ථාව යටතේ මින් ඉදිරියට පළ කරනු ලබන සෑම පාරක්ම අඩි 16 ක් පලල් විය යුතුයයිද, සෑම අඩි පාරක්ම අඩි 6 ක් පලල් විය යුතුයයිද, එම පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 4 වෙනි කාණ්ඩයේ 6 වෙනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර එකී සෑම පාරකම මෙගොඩපොත ගම්සභාවේ සභාපති තුමාගෙන් ලියවිල්ලකින් බලයක් හෝ අවසරයක් හෝ සභාපති තුමා සමග අත්සන් කරන ලද ගිවිසුමක් නොමැතිව මෙම පාරවල් වල හෝ අඩි පාරවල්වල ලොරි, බස්, ට්‍රැක්ටර් හෝ මුළු බර ටොන් එකහමාරකට ($1\frac{1}{2}$) වැඩි බර ඇති වෙනත් අන්දමක ඕනෑම වාහනයක් ධාවනය කිරීම හෝ මංමාවතක හෝ අඩි පාරක අලි ඇතුන් ලවා ගල් හෝ ලී කොටන් ඇද්දවීම තහනම් කළ යුතුයි."

8–294—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

වැලිසර සුළු නගර සභාව

විදුලි බල ගාස්තු ප්‍රතිශෝධනය කිරීම

වර්ෂ 1957 අංක 59 දරණ විදුලි බල (සංශෝධිත) පනතින් සංශෝධිත වර්ෂ 1950 අංක 19 දරණ විදුලි බල පනතේ 36 වැනි ඡේදය ප්‍රකාර හා වැලිසර සුළු නගර සභාවට නිකුත් කර ඇති වර්ෂ 1971 සැප්තැම්බර් මස 7 වැනි දින දරණ විදුලි බල පනතේ ''බී'' උපලේඛනයෙහි සඳහන් 8 වැනි වගන්තිය ප්‍රකාර, ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන විදුලි පරීක්ෂකතුමා වෙත පැවරී ඇති බලතල අනුව එතුමා විසින් එම බලපත්‍රයේ සඳහන් ගාස්තු පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති බවත්, 1973 ජූලි මස 1 වැනි දින සිට නව ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක වන බව මහජනයා වෙත මෙයින් දන්වමි.

එච්. රොබට් ප්‍රනාන්දු,
සභාපති,
වැලිසර සුළු නගර සභාව.

1973 ජූලි මස 12 වැනි දින,
වැලිසර සුළු නගර සභා කාර්යාලයේදීය,
රාගම.

ගාස්තු චක්‍රය

වැඩිම මිල හා අය කිරීමේ ක්‍රම :

ගාස්තු අංක 1 (පහන්, පංකා හා පොදු කටයුතු සඳහා)

1. මාසික පරිභරණය—

පළමුවන ඒකක 300 ඒකකයක් ශත 55 බැගින්
දෙවන ඒකක 250 ඒකකයක් ශත 50 බැගින්
තෙවන ඒකක 250 ඒකකයක් ශත 45 බැගින්
ඒකක 800 ට අමතරව සෑම ඒකකයක්ම සත 40 බැගින්.

2. අඩුම අය කිරීම මසකට රු. 6 බැගින් (මනුකුළිය හැර)
මනු කුලිය මසකට රු. 1/—බැගින්.

ගාස්තු අංක 2 (ගාමක බලය සඳහා හෝ විද්‍යුත් රසායනික නැතහොත් විද්‍යුත් තාප ක්‍රියා සඳහා)

1. මාසික පරිභරණය—

පලමුවන ඒකක 500 ඒකකයක් ශත 27 බැගින්
දෙවන ඒකක 300 ඒකකයක් ශත 25 බැගින්
තෙවන ඒකක 200 ඒකකයක් ශත 23 බැගින්
ඒකක 1000 ට අමතරව සෑම ඒකකයක්ම ශත 21 බැගින්.

2. අඩුම අය කිරීම මසකට රු. 6/— බැගින් (මනුකුළිය හැර) නැතහොත් නිර්ණිත අවශ්‍යතාවේ කි.වෝ.ඇ. එකක හෝ ඉන් කොටසක් හෝ සඳහා රු. 1/—බැගින් යන දෙකින් වැඩි ගණන.

3. මනු කුලිය මසකට රු. 1/—බැගින්.

ගාස්තු අංක 3 (බාහිර පහන්, සංඥා, සිනමාහල් හා නාට්‍යශාලා සඳහා)

1. මාසික පරිභරණය—

පලමුවන ඒකක 500 ඒකකයක් ශත 35 බැගින්
දෙවන ඒකක 300 ඒකකයක් ශත 33 බැගින්
තෙවන ඒකක 200 ඒකකයක් ශත 31 බැගින්
ඒකක 1000 ට අමතරව සෑම ඒකකයක්ම ශත 29 බැගින්.

2. අඩුම අය කිරීම මසකට රු. 6/—බැගින් හෝ (මනුකුළිය හැර) නැතහොත් නිර්ණිත අවශ්‍යතාවේ කි.වෝ.ඇ. එකක් හෝ ඉන් කොටසක් හෝ සඳහා රු. 1/—බැගින් යන දෙකින් වැඩි ගණන.

3. මනු කුලිය මසකට රු. 1/—බැගින්.

ගාස්තු අංක 4 (ගෘහිය කටයුතු සඳහා)

1. සැපයුම මනුගත කොට දෙකොටස් ගාස්තු ක්‍රමයකට අනුව අය කෙරෙනු ඇත. ස්ථාවර ගාස්තුව වෙනුවෙන් පහත සඳහන් උපලේඛනය අනුව පිළියෙල කළ ගාස්තුවකින්ද සියළුම කටයුතු සඳහා පරිභරණය කරන ලද ඒකක සඳහා ඒකකයක් ශත 13 බැගින් වූ ඒකක ගාස්තුවකින්ද මෙම දෙකොටස් ගාස්තු ක්‍රමය සමන්විත වන්නේය.

2. ස්ථාවර ගාස්තුව (මනු කුලියත් ඇතුළුවයි)

වර්ග අඩි 1500ට නොවැඩි නම් මසකට රු. 5 බැගින්
වර්ග අඩි 1750ට නොවැඩි නම් මසකට රු. 6 බැගින්
වර්ග අඩි 2000ට නොවැඩි නම් මසකට රු. 7 බැගින්
වර්ග අඩි 2250ට නොවැඩි නම් මසකට රු. 8 බැගින්
වර්ග අඩි 2500ට නොවැඩි නම් මසකට රු. 9 බැගින්
වර්ග අඩි 3000ට නොවැඩි නම් මසකට රු. 10 බැගින්
වර්ග අඩි 3500ට නොවැඩි නම් මසකට රු. 11 බැගින්
වර්ග අඩි 4000ට නොවැඩි නම් මසකට රු. 12 බැගින්
වර්ග අඩි 4500ට නොවැඩි නම් මසකට රු. 13 බැගින්
වර්ග අඩි 5000ට නොවැඩි නම් මසකට රු. 14 බැගින්
වර්ග අඩි 5500ට නොවැඩි නම් මසකට රු. 15 බැගින්
වර්ග අඩි 6000ට නොවැඩි නම් මසකට රු. 16 බැගින්
වර්ග අඩි 6500ට නොවැඩි නම් මසකට රු. 17 බැගින්
වර්ග අඩි 7000ට නොවැඩි නම් මසකට රු. 18 බැගින්
වර්ග අඩි 8000ට නොවැඩි නම් මසකට රු. 19 බැගින්
වර්ග අඩි 9000ට නොවැඩි නම් මසකට රු. 20 බැගින්
වර්ග අඩි 10000 නොවැඩි නම් මසකට රු. 21 බැගින්

සෑම අතිරේක වර්ග අඩි 2000 කට හෝ ඉන් කොටසකට මසකට රු. 1/ බැගින්.

3. කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තුව ඉහත උපලේඛන ගත කර ඇති ස්ථාවර ගාස්තුව අනුව විය යුතුය.

4. වර්ග ප්‍රමාණයෙන් සියයට 25 ට අඩු ගෙබිම් ප්‍රමාණයක් වෘත්තිය හෝ වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන ගෘහිය ස්ථාපන සඳහා ස්ථාවර ගාස්තු ගණන් බැලීමේදී ගෘහීය කටයුතු සඳහා පාවිච්චි කරණු ලබන කොටස් වෙනුවෙන් ඉහත දක්වෙන 2 වැනි ඡේදය යටතේද වෘත්තිය හා වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන විදුලි බලය වෙනුවෙන් ස්ථාවර ගාස්තුව අංක 6 දරණ ගාස්තු ක්‍රමයේ 2 වැනි ඡේදය යටතේද වෘත්තිය හා වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන විදුලි බලය වෙනුවෙන් ස්ථාවර ගාස්තුව අංක 6 දරණ ගාස්තු ක්‍රමයේ 2 වැනි ඡේදය යටතේද පිළියෙල කරනු ලැබේ.

5. වාසස්ථානයේ 'ගෙබිම' යන්නෙන් අදහස් කරනු ලබන්නේ එම වාසස්ථානයට අයත් ප්‍රදේශය ඇතුලත පිහිටියාවූ සියළුම ස්ථිර ගොඩනැගිලි වල මුළු බාහිර ගෙබිම් ප්‍රමාණයවේ.

ගාස්තු අංක 5 (කාර්මික කටයුතු සඳහා)

1. මෙම ගාස්තු ක්‍රමය පහන් හා පංකා බැර බල බැර මෙන් සියයට හතලිහකට නොවැඩි කර්මාන්තශාලාවල, වැඩපොලවල, වාත්තු මඩුවල, තෙල් මෝල්වල, නූල් කැටීමේ හා රෙදි විවීමේ මෝල්වල, කොහු මෝල් වල, ලී මෝල්, සහල් මෝල, පොම්ප කරන ස්ථානවල සහ වෙනත් එවැනි කාර්මික ස්ථානවල ගාමක බලය සඳහා හෝ විද්‍යුත් රසායනික නොහොත් විද්‍යුත් තාප ක්‍රියා වලින් සම්පූර්ණ වශයෙන්ම හෝ ප්‍රධාන වශයෙන්ම භාවිතා කෙරෙන විදුලිය වෙනුවෙන් අදල වන්නේය.

මෙම සැපයුම මනු ගත කොට දෙකොටස් ගාස්තු ක්‍රමයකට අනුව අය කෙරෙනු ඇත. අවශ්‍යතාව හා උපරිම අවශ්‍යතාව වෙනුවෙන් පහත සඳහන් උපලේඛනය අනුව පිලියෙල කල ගාස්තුවකින්ද සියළුම කටයුතු සඳහා පරිභරණය කරන ලද ඒකක සඳහා ඒකකයක් ශත 14 බැගින් වූ ඒකක ගාස්තුවකින්ද එම දෙකොටස් ගාස්තු ක්‍රමය සමන්විත වන්නේය.

2. අවශ්‍යතා ගාස්තුව (මනු කුළියත් ඇතුළුවයි).

නිර්ණිත අවශ්‍යතාව කි.වෝ.ඇ. 20 කට නොවැඩි ස්ථාපන වෙනුවෙන් මසකට කි.වෝ.ඇ. එකකට හෝ ඉන් කොටසකට හෝ රු. 9/– බැගින් කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තු වනුයේ රු. 27 ක අඩුම ගාස්තුවකට යටත්වූ නිර්ණිත අවශ්‍යතාවේ කි.වෝ.ඇ. සංඛ්‍යාව අනුව ගණන් බැලූ ගාස්තුවකි.

3. උපරිම අවශ්‍යතා ගාස්තුව (මනු කුලියක් ඇතුළුවයි).

කි.වෝ.ඇ. 20 කට වැඩි ස්ථාපන වෙනුවෙන් උපරිම අවශ්‍යතාවේ මුල් කි.වෝ.ඇ. 25 හේ එක් එක් කි.වෝ.ඇ. වෙනුවෙන් කි.වෝ.ඇ. එකක් රු. 9 බැගින් උපරිම අවශ්‍යතාවේ කි.වෝ.ඇ. 25 ට වැඩි වූ කි.වෝ.ඇ. 50 ට නොවැඩි එක් එක් කි.වෝ.ඇ. වෙනුවෙන් කි.වෝ.ඇ. එකක් රු. 8.50 බැගින් උපරිම අවශ්‍යතාවේ කි.වෝ.ඇ. 50 ට වැඩි සෑම කි.වෝ. ඇ. එකක් වෙනුවෙන් කි.වෝ.ඇ. එකක් රු. 8 බැගින්.

4. කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තුව වනුයේ රු. 180 කි.

ගාස්තු අංක 6 (වාණිජ කටයුතු සඳහා)

1. මෙම ගාස්තු ක්‍රමය සාප්පුවල, කාර්යාලවල, බැංකුවල, ගුදම්වල, බලපත්‍රලත් හෝටල්වල, තේ පැන් ශාලාවල, පොදු ගොඩනැගිලිවල, රෝහල්වල, දුම්රියපොලවල, අධ්‍යාපනික ආයතනවල හා වෙනත් එවැනි ස්ථානවල භාවිතා කෙරෙන විදුලි බලය සැපයීම වෙනුවෙන් අදල වන්නේය. මෙම සැපයුම මනුගත කොට දෙකොටස් ගාස්තු ක්‍රමයකට අනුව අය කෙරෙනු ඇත. අවශ්‍යතාවය හා උපරිම අවශ්‍යතාව වෙනුවෙන් පහත සඳහන් උපලේඛනය අනුව පිලියෙල කළ ගාස්තුවකින්ද සියළුම කටයුතු සඳහා පරිභරණය කරන ලද ඒකක සඳහා ඒකකයන් ශත 14 බැගින් වූ ඒකක ගාස්තුවකින්ද මෙම දෙකොටස් ගාස්තු ක්‍රමය සමන්විත වන්නේය.

2. අවශ්‍ය ගාස්තුව (මනු කුලියක් ඇතුළුවයි)

නිර්ණිත අවශ්‍යතාව කි.වෝ.ඇ. 20 කට නොවැඩි ස්ථාපන වෙනුවෙන් මසකට එක් එක් කි.වෝ.ඇ. එකකට හෝ ඉන් කොටසකට හෝ රු. 16 බැගින්.

කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තුව වනුයේ රු. 48 ක අඩුම් ගාස්තුවකට යටත්වූ නිර්ණිත අවශ්‍යතාවේ කි.වෝ.ඇ. ප්‍රමාණය අනුව ගණන් බැලූ ගාස්තුවකි.

3. උපරිම අවශ්‍යතා ගාස්තුව (මනු කුලියත් ඇතුළුවයි)

කි.වෝ.ඇ. 20 කට වැඩි ස්ථාපන වෙනුවෙන් උපරිම අවශ්‍යතාවේ මුල් කි.වෝ.ඇ. 25 හේ එක් එක් කි.වෝ.ඇ. වෙනුවෙන් කි.වෝ.ඇ. එකක් රු. 16 බැගින් උපරිම අවශ්‍යතාවේ කි.වෝ.ඇ. 25 ට වැඩි වූ කි.වෝ.ඇ. 50 ට නොවැඩි එක් එක් කි.වෝ.ඇ. වෙනුවන් කි.වෝ.ඇ. එකක් රු. 14 බැගින් උපරිම අවශ්‍යතාවේ කි.වෝ.ඇ. 50ට වැඩි සෑම කි.වෝ.ඇ. එකක් රු. 12.

4. කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තුව වනුයේ රු. 320.

5. එක් එක් පහන් අල්ලුවක් වෙනුවෙන් වොට් 25 කට නොඅඩු පහන් බැර තක්සේරුවට අවශ්‍යතා ගාස්තු උපලේඛනය යටත්වනු ඇත.

6. සියළු පංකා බැර තක්සේරු කල යුත්තේ එකකට වොට් 50 බැගින්.

ගාස්තු අංක 7 (තාවකාලික ආලෝක කිරීම් සඳහා)

1. දනට පවත්නා මනුවට අතිරේක අවශ්‍යතාව දුරිය හැකි නම් දනට සිටින පාරිභෝගිකයන්ගෙන් ඔවුනට නියමිත ගාස්තු ක්‍රම අනුව විදුලි බල ගාස්තු අය කරනු ලැබේ.

(අ) දනට පවත්නා මනුවක් මගින් විදුලි බලය සපයන විට විදුලි බල ගාස්තුවකට අතිරේකව රු. 5ක ගාස්තුවකින් අය කරනු ලැබේ.

(ආ) විශේෂ මනුවක් මගින් විදුලි බලය සපයන විට අංක 1 දරණ පොදු ගාස්තු ක්‍රමයට අතිරේක රු. 10 ක ගාස්තුවක් අයකරනු ලැබේ. මෙම ගාස්තු ක්‍රමය ප්‍රසිද්ධ සිද්ධස්ථානවලවලට අදල නො වන්නේය.

2. තාවකාලික පාරිභෝගිකයන්ගෙන් අංක 1 දරණ පොදු ගාස්තු ක්‍රමය යටතේ විදුලි බල ගාස්තු අය කරනු ලැබේ. මීට අතිරේකව මනු සහ සේවා ගාස්තු අය කරනු ලැබේ.

ගාස්තු අංක 8 (ප්‍රසිද්ධ සිද්ධස්ථාන සඳහා)

මෙම ගාස්තු ක්‍රමය මහජනයා වැඳුම් පිදුම් කරන ස්ථානයක් ඇතුලත පිහිටියාවූත්, වැඳුම් පිදුම් කරන ස්ථානයේ පූජකවරුන් පදිංචිව සිටින්නාවූත් නේවාසිකාගාර ඇතුළු ප්‍රසිද්ධ සිද්ධස්ථානවල භාවිතා කෙරෙන විදුලිය සැපයීම වෙනුවෙන් අදල වන්නේය.

ඒකකයක් ශත 20 බැගින්,

මනු කුලිය රු. 1යි.

විවිධ ගාස්තු

1. ස්ථාපන පරීක්ෂා කිරීම :

(අ) නව ස්ථාපන සහ පවත්නා ස්ථාපන විශාල කිරීම් පළමුවරට පරීක්ෂා කිරීම නොමිළයේ

(ආ) පළමුව පරීක්ෂණය අසතුටුදයක නම් එක් එක් අතිරේක පරීක්ෂණ යක් සඳහා—

සම්පූර්ණ ස්ථාපන රු. 10

විශාල කිරීම් රු. 5.

2. මනු පරීක්ෂා කිරීම :

පාරිභෝගිකයාගේ අයදුම් මත මනුව පරීක්ෂා කිරීමට රු. 10යි.

මනුවේ දෝෂය සියයට 2½කට අඩු හෝ වැඩි නම් ගාස්තුව ආපසු දෙනු ලැබේ.

3. නැවත සම්බන්ධ කිරීමේ ගාස්තුව :

(අ) මුදල් නොගෙවීම මත විසම්බන්ධ කරනු ලැබූ සැපයුම නැවත සම්බන්ධ කිරීම රු. 10

(ආ) නියෝග කඩ කිරීම මත විසම්බන්ධ කරනු ලැබූ සැපයුම නැවතත් සම්බන්ධ කිරීම රු. 15

(ඇ) පැය 48කට අඩු කාලයකින් දනුම් දුන් විට විශේෂ නැවත සම්බන්ධ කිරීමේ ගාස්තුව රු. 2.

4. සැපයුම බිඳ වැටීම :

විලායකකරුවන්ගේ සේවය සඳහා ගාස්තුව රු. 2.

සටහන්

1. ගාස්තු ක්‍රම අංක 5 සහ 6—මුළු පරිහරණ ප්‍රමාණයටම අදල ගාස්තු ක්‍රමය යටතේ මුදල් අය කරනු ඇත. එසේ නැතහොත් පාරිභෝගිකයාගේ කැමැත්ත පරිදි පහන්, පංකා, ශීතකරණ සහ අධි ශීතකරණ සඳහා අංක 1 දරණ ගාස්තු ක්‍රමය යටතේද ගාමක බලය සඳහා සහ විද්‍යුත් රසායනික නැතහොත් විද්‍යුත් තාප ක්‍රියා අංක 2 දරණ ගාස්තු ක්‍රමය යටතේද මුදල් අය කරනු ඇත.

අංක 4 දරණ ගෘහීය ගාස්තු ක්‍රමය 4 වැනි ඡෙදය යටතේ වෘත්තිය හෝ වෙළඳ බැර තක්සේරු කිරීමේදී ස්ථාවර ගාස්තුව ක්‍රමානුකූල ක්‍රමයකට කිට්ටුම ඊළඟ සම්පූර්ණ රුපියලට නිශ්චය කරනු ඇත. මෙහිදී අංක 6 දරණ ගාස්තු ක්‍රමයේ 2 වැනි ඡෙදය යටතේ අඩුම ගාස්තුව අදල නොවන්නේය.

මසකින් කොටසකට සැපයුම සඳහා ස්ථාවර ගාස්තුව අඩුම ගාස්තුව හා මනු කුලිය ප්‍රමානුකූල ක්‍රමයකට ගණන් ගනු ඇත.

උපරිම අවශ්‍යතාව කි.වෝ.ඇ. වනුයේ මිනිත්තු 15ක කාලයක් තුළ ප්‍රකාශිත වෝල්ටීයතාව අනුව ගිනූ විදුලි බල ප්‍රමාණය වේ.

8–40—73.08.03 වැනි දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පණතේ 2 වැනි වගන්තියේ ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිතයව දක්වන XVIII වැනි කාණ්ඩය පිළි ගැනීමටත්, එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට මාතර දිස්ත්‍රික්කයේ මොරවක ගම් සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත් 1973 ජූනි මස 30 වන දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 4 දරණ යෝජනාව නිරණය වූ බව මොරවක ගම් සභාවේ සභාපති වන හත්තොටුවෙ ගමගේ වීරසිංහ වන මම මෙයින් දන්වා සිටිමි.

එච්. ජී. වීරසිංහ,
මොරවක ගම් සභාවේ සභාපති.

1973 ජූලි මස 16 වන දින,
මොරවක පිහිටි
මොරවක ගම් සභා කාර්යාලයේ දී ය.

අතුරු ව්‍යවස්ථාව

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වන කොටසෙහි අන්තරාදයක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථාව පහත සඳහන් පරිදි වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—"1 මෙම අතුරු ව්‍යවස්ථා වල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි, 1 වැනි කොටසේ, දෙවැනි කොටසේ හෝ 3 වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ" නවද,

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

උපලේඛනය

1 වැනි කොටස

අන්තරාදායක ව්‍යාපාර

කඩුක්, බොරළු හෝ කළු ගල් තැනීම.

කඩුක්, බොරළු හෝ කළු ගල් ගබඩා කිරීම.

සිසිල් බීම නිෂ්පාදනය.

ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම ගබඩා කර තැබීම.

අයිස් නිපදවීම.

කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම, හෝ ගබඩා කර තබා ගැනීම.

යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින්, එළවළු තෙල් නිශ්කරණය.

ගැළුම් 50 වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩා කර තබා ගැනීම.

පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක්, ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ගිණි පෙට්ටි නිෂ්පාදනය.

ග්‍රෝස් 10 වැඩි ප්‍රමාණයකට වඩා ගිණිපෙට්ටි ගබඩා කර තබා ගැනීම.

ඉඹුල් පුළුන් හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම.

මැතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.

තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පිදුරු ගබඩා කර තබා ගැනීම.

කුලියට දීමට ලාම්පු ගබඩා කර තබා ගැනීම.

පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම.

ධාන්‍ය හෝ මෑෂ භෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම, හෝ අළුත්වැඩියා කිරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.

අතින් ලී ඉරණ ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.

දැව ගබඩාවක් පවත්වාගෙන යාම.

දර ගබඩාවක් පවත්වාගෙන යාම.

ගිරි ගල් හෝ හුණු ගල් සැදීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යාම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරණ කම්හලක් පවත්වාගෙන යාම.

තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 කට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

හිස් බෝතල හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම.
බයිසිකල් හෝ මෝටර් බයිසිකල් අළුත් වැඩියා කිරීම සඳහා වැඩ පොලක් පවත්වාගෙන යාම.
අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පොල් කටු ගබඩා කර තබා ගැනීම.

ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම
විසිරි පින්තාරු (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.
සිල්ක් සහ කෘත්‍රිම රෙදි විවීම හා විසිතුරු කිරීම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

## II වැනි කොටස

### අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පෝර හෝ රසායනික පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
හම් ගබඩා කර තබා ගැනීම.
උම්බලකඩ නිෂ්පාදනය කිරීම, හෝ හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම.

කුකුලන් සියයට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම.
බැටළුවන්, එළුවන්, හෝ ඌරන් 10 කට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම.
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
තොග වශයෙන් විකිණීම සඳහා නරක් විය හැකි කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
කරවල, ලුණු මාළු හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේළීම හෝ අයිස් දැමීම.
අඟුරු සඳහා දැව හෝ පොල් කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.
සිමෙන්ති හොණ්ඩර 25 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
දුං කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම.
පුනක්කු ටොන් 1 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
සත්ව ආහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.

සතුන්ගේ මාංශාවශේෂ ලේ පැසවීම.
සබන් නිෂ්පාදනය කිරීම.
සව් හෝ මංඤොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.
ඇට කටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යාම.
ටිරන්ක් පෙට්ටි සෑදීම.

අලුත් හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.
ලෝහමය සුංඛුං ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
කොන්ක්‍රීට් මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.
සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.
රස කැවිලි වර්ග නිපදවීම.

පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම.
මේද නිපදවීම හෝ නිශ්කරණය කිරීම.
දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.
දත් බුරුසු නිපදවීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර ගැනීම.
හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම.
පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
පින්තාරු තීන්ත, වාර්නිස් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයකින් ගබඩා කර තබා ගැනීම.

ලෑලි සකස් කිරීම හෝ පදම් කිරීම.
සෝඩා නිපදවීම.
රෙදි සායම් කිරීම.
කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.
සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.

පළතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින් වල ඇසිරීම.
කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ භෝග කෙටීම.

බේකිං පවුඩර් නිපදවීම.
මාජරිං නිපදවීම.
ගෑස් මැන්ටල් නිපදවීම.

පොට් නිපදවීම.
ඉටිපන්දම් නිපදවීම.
කපුරු නිපදවීම.
ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
රෙදි සෝදන නිල් නිපදවීම.
සායම් කුඩු නිපදවීම.
ලාකඩ නිපදවීම.
සුවඳ පූයර නිපදවීම.

පාසැල් රට හුණු නිපදවීම.
ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

ටයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.
ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.
පාසැල් ගල්ලෑලි නිපදවීම.
සෞඛ්‍ය තුවා කඩ නිපදවීම.
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.
මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම.
ශීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම.
කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
මැණික් ගල් කැපීම හා ඔප දැමීම.
දිය හුණු, සුදු (වයිටිං) හුණු හෝ හිරියල් නිපදවීම.
එන්සාල්, (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

## III වැනි කොටස

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තාලාතු මිනිරන් සුද්ධ කිරීම.
රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.
ඩ්‍රයි ක්ලීනින් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.

රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම.
විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

තෙල් හෝ සත්ව මේද පැසවීම.
හුණු පිලිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැපීම.

මැටි බඳුන් ඔප දැමීම.
ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හොණ්ඩර 3 ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම.

බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම, වැඩ පොලක් පවත්වාගෙන යාම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.
බෙලෙක් වැඩ පොලක් පවත්වාගෙන යාම.
ගල් ස්මාරක නිපදවීම.
පැට්‍රල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වා ගෙන යාම.

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.
කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
විෂ බීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මදුරු කව (කොයිල්ස්) නිපදවීම.
ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.
රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.
ගල්තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම.
වීදුරු භාණ්ඩ නිපදවීම.
වීදුරු කැඩපත් නිපදවීම.
යකඩ තහඩු, ගැල්වනයිස් කිරීම.
පාස්සන ඊයම් නිපදවීම.

ඇළුමිනියම් භාණ්ඩ නිපදවීම.
කටු කම්බි නිපදවීම.
කම්බි ඇණ නිපදවීම.
කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.
බෙලෙක් බඳුන් වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.

ජී. අයි. බාල්දි නිපදවීම.
වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම.
සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

බ්රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.
යන්ත්‍රෝපකරණ නිපදවීම.
විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කැවුණු කෙදි වර්ග නිපදවීම.
සංචායක බැටරි නිපදවීම.
වියලි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

රන්කම් සුන්බුන් වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.
රේඩියෝටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩ පොලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩ පොලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩ පොලක් පවත්වාගෙන යාම.

8–36—73.08.03 දින අංක 71 දරණ ගැසට් පත්‍රය

---

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත (261 වැනි අධිකාරිය)**

පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ තුන්වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ උඩපළාත බටහිර ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

යෝජනාව

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වන දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදන යෙන් ප්‍රකාශකරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වාවූ කාණ්ඩද, (අංක 1 සහ 37 වැනි කාණ්ඩ දෙකම ඇතුළත්ව)

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදන යෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩයද, පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 ජූනි මස 8 වැනි දින දරණ අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වන දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39 සිට 41 දක්වා කාණ්ඩද (අංක 39 සහ 41 වැනි කාණ්ඩ දෙකම ඇතුළත්ව)

මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දිනසිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මතකර ගැනීමට මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ උඩපළාත බටහිර ගම්සභාව විසින් ප්‍රාදේශික බලමණ්ඩල (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබඳ ආඥාපනතේ (261 වෙනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ යෝජනා කර සිටිනු ලැබේ.

කේ. ඇම්. රාජපක්ෂ,
සභාපතිතැන,
තුම්පනේ උඩපළාත බටහිර ගම්සභාව.

1973 ජූලි මස 18 වැනි දින,
අලුදෙනිය,
තුම්පනේ උඩපළාත බටහිර ගම්සභා කාර්යාලයේදීය.

8-80 —73.08.03 දින අංක 71 දරන ගැසට් පත්‍රය

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. **1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| **එක් කොටසක්** ... ... ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 50 | ... | 51 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... | 0 50 | ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 0 | ... | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 30 | ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 60 | ... | 0 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි ජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.27 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.03 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.10 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.17 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.24 | සිකුරාද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.07 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.14 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.21 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.